# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 සැප්තැම්බර් මස 15 වන දින
## II කොටස

## අතිරේකය

## (2023.09.15 දින නිකුත් කරන ලදී)


# ත්‍රස්ත විරෝධී

**ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාවලින්, ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් සහ ත්‍රස්තවාදය පිළිබඳ වරද සංස්ථාපනය වන ඇතැම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාවලින් ලංකාවේ ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකාවේ භූමිය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තකු අනාවරණය කර ගැනීම, හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, රඳවා තැබීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 156.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය *www. documents. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ත්‍රස්ත විරෝධී

එල්. ඩී. -ඕ 15/2023.

**ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාවලින්, ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් සහ ත්‍රස්තවාදය පිළිබඳ වරද සංස්ථාපනය වන ඇතැම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාවලින් ලංකාවේ ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ද; ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකාවේ භූමිය සහ එහි ජනතාව භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තකු අනාවරණය කර ගැනීම, හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, රඳවා තැබීම, පරීක්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

**පූර්විකාව**

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට ත්‍රස්තවාදය බරපතළ තර්ජනයක් වී ඇති හෙයින් සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් මරණයට පත් කිරීම හා ඔවුන් වෙත බරපතල තුවාල සිදු කිරීමට හේතුවී ඇති හෙයින් ද; ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික දේපළවලට එමගින් බරපතල අලාභහානි සිදුවී ඇති හෙයින් : සහ ජාතික සංවර්ධනය මන්දගාමී වී ඇති හෙයින් ද;

ත්‍රස්තවාදය විවිධ ආකාරවලින් සහ ස්වරූපවලින් ජාත්‍යන්තර ප්‍රජාවෙහි සාමයට සහ ආරක්ෂාවට ප්‍රබල තර්ජනයක් වී ඇති හෙයින් සහ ත්‍රස්තවාදී ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ශ්‍රී ලංකාව, එහි ජනතාව සහ දේපළ ආරක්ෂා කිරීම රජයේ ප්‍රමුඛ වගකීමක් වන හෙයින් ද;

ශ්‍රී ලංකාව අත්සන්කරුවකු වී සිටින ත්‍රස්තවාදී ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වැළැක්වීමට අදාළ ජාත්‍යන්තර සාධනපත්‍රවලට දේශීය වශයෙන් නෛතික බලයක් ලබාදීම සඳහා නීති පැනවීමට ශ්‍රී ලංකාව වගකීමෙන් බැඳී සිටින හෙයින් ද;

ත්‍රස්තවාදී ක්‍රියාවල ව්‍යසනයෙන් වෙනත් ස්වෛරී ජාතීන් සහ ඒවායේ ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය කැපවී සිටින හෙයින් ද;

ජාත්‍යන්තර මාන හා ප්‍රමිතින් මෙන්ම දේශීය අවශ්‍යතා මත පදනම්ව ත්‍රස්තවාදයට එරෙහිව අපරාධ යුක්තිය පසිඳලීම සඳහා ඵලදායී ක්‍රමයක් බලාත්මක කිරීම තුළින් ශ්‍රී ලංකාව විසින් දේශීය සහ ජාත්‍යන්තර ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීම සහ වැළැක්වීම සඳහා කැපවී සිටින හෙයින් සහ කැමැත්තෙන් සිටින හෙයින් ද;

ශ්‍රී ලංකාවේ ජනතාවගේ අයිතිවාසිකම් සහ නිදහසට නිසි පිළිගැනීමක් සහ ගෞරවයක් ලබා දීම සුරක්ෂිත කිරීමේ සහ ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීමේ සහ ශ්‍රී ලංකාවේ ජනතාවගේ ස්වෛරීභාවය වර්ධනය කිරීමේ කාර්ය සඳහා ජාතික ආරක්ෂාව ආරක්ෂා කිරීම සුවිශේෂී වැදගත්කමකින් යුතු වන බවට ශ්‍රී ලංකා රජය සලකනු ලබන හෙයින් ද;

ත්‍රස්තවාදයට එරෙහිව අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රමය සාධාරණ සහ යුක්තිසහගත ලෙස අදාළ කරගැනීමට වගබලා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ශ්‍රී ලංකා රජය සැලකිලිමත් වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2023 අංක      දරන ත්‍රස්ත විරෝධී පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**I** වන කොටස

**පනත අදාළ වීම**

2. (1) මේ පනතේ විධිවිධාන, පහත දැක්වෙන තැනැත්තන් ඇතුළුව, ශ්‍රී ලංකාවේ දේශ සීමාව තුළ දී හෝ ඉන් පිටත දී මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකුට අදාළ විය යුතු ය:- පනත අදාළ වීම

(අ) ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී හෝ ඉන් පිටත දී මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;

(ආ) මේ පනත යටතේ වන වරදක් -

(i) ශ්‍රී ලංකාව තුළ දී සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(ii) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළ දී හෝ එයට ඉහළින් සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(iii) ශ්‍රී ලංකාවේ ගුවන් තලයෙහි සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(iv) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද හෝ ශ්‍රී ලංකා රජයට අයත් හෝ ශ්‍රී ලංකා රජය විසින් භාවිත කරනු ලබන ගුවන් යානයක හෝ යාත්‍රාවක සිට හෝ එබඳු ගුවන් යානයක් හෝ යාත්‍රාවක් සම්බන්ධයෙන් හෝ සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(v) ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය සහ ගුවන් තලය ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශය තුළ යම් ගුවන් යානයක හෝ යාත්‍රාවක සිට හෝ එබඳු ගුවන් යානයක් හෝ යාත්‍රාවක් සම්බන්ධයෙන් හෝ සිදු කරනු ලබන තැනැත්තකු;

(vi) ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩලයක හෝ කොන්සල් දූත මණ්ඩලයක හෝ කාර්යාල පරිශ්‍රය තුළ දී හෝ එකී පරිශ්‍රය සම්බන්ධයෙන් හෝ ශ්‍රී ලංකාවේ කොන්සල් නිලධරයකු සම්බන්ධයෙන් හෝ එකී රාජ්‍ය දූත මණ්ඩලයේ හෝ කොන්සල් දූත මණ්ඩලයේ ප්‍රධානයාගේ පදිංචි ස්ථානය තුළ හෝ එම රාජ්‍ය දූත මණ්ඩලයේ හෝ කොන්සල් දූත මණ්ඩලයේ නිලධරයකුගේ හෝ වෙනත් සේවානියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළ දී, සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් සිදු කරන යම් තැනැත්තකු;

(vii) ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති යම් කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ එම පරිශ්‍රය සම්බන්ධයෙන් හෝ එවැනි ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් සේවානියුක්තයකුගේ පදිංචි ස්ථානය තුළ දී

සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ සිදු කරන යම් තැනැත්තකු;

(ඇ) මේ පනත යටතේ වන වරදක් -

(i) ජාත්‍යන්තර සාමය ආරක්ෂා කිරීමේ මෙහෙවරක හෝ නියාමනය කිරීමේ මෙහෙවරක යෙදී සිටින පුරවැසියකු ඇතුළුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු සම්බන්ධයෙන්;

(ii) රජයට අයත් යම් දේපළක් සම්බන්ධයෙන්,

ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී හෝ ඉන් පිටත දී සිදු කරනු ලබන යම් තැනැත්තකු;

(ඈ) මේ පනත යටතේ වන වරදක් ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී හෝ ඉන් පිටත දී සිදු කරන ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටින ලද යම් තැනැත්තකු:

එසේ වුව ද, ඒ තැනැත්තා ශ්‍රී ලංකාව තුළ ස්වකීය නිත්‍ය පදිංචිය අඛණ්ඩව පවත්වාගෙන යන්නේ නම් පමණක් එම තැනැත්තා සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන බලාත්මක කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, ඔහු ශ්‍රී ලංකාව තුළ ස්වකීය නිත්‍ය පදිංචිය පවත්වාගෙන නොයන්නේ නම්, එම තැනැත්තා පුරවැසියකු වන්නා වූ විදේශ රාජ්‍යයේ එකඟත්වය ඇතිව, මේ පනතේ විධිවිධාන බලාත්මක කරනු ලැබිය හැකි ය; සහ

(ඉ) මේ පනත යටතේ වන වරදක් ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී හෝ ඉන් පිටත දී සිදුකරන ශ්‍රී ලංකාව තුළ ස්වකීය නිත්‍ය පදිංචිය පවත්වාගෙන යන යම් තැනැත්තකු.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා -

"නිත්‍ය පදිංචිය" යන්නෙන්, යම් තැනැත්තකු සිරිත් පරිදි පදිංචිව සිටින ස්ථානය අදහස් වේ;

"රජයට අයත් දේපළ" යන්නට -

(අ) රාජ්‍ය සංස්ථාවලට සහ ව්‍යවස්ථාපිත අරමුදල්වලට හෝ මණ්ඩලවලට;

(ආ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ රජය සතු වූ ව්‍යාපාරවලට සහ වෙනත් ව්‍යවසායයන්ට; සහ

(ඇ) ඒ සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දරනු ලබන, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන යම් සමාගමකට,

අයත් දේපළ ද ඇතුළත් වේ.

## II වන කොටස

## වැරදි සහ දණ්ඩන

ත්‍රස්තවාදය පිළිබඳ වරද

3. (1) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ නීතිවිරෝධී නොකර හැරීමක් -

(අ) මහජනතාව හෝ එහි යම් කොටසක් බිය ගැන්වීමේ අරමුණින් යුතු ව;

(ආ) යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීමෙන් වැළකී සිටීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් යම් ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස පෙලඹවීමේ අරමුණින් යුතුව; හෝ

(ඇ) යුද්ධය ව්‍යාප්ත කිරීමේ හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්වෛරී රටක භෞමික අඛණ්ඩතාව උල්ලංඝනය කිරීමේ හෝ එහි ස්වෛරී බව කඩ කිරීමේ අරමුණින් යුතු ව,

සිදු කරනු ලබන යම් තැනැත්තකු ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ නීති විරෝධී නොකර හැරීමක් පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) මිනීමැරීම;

(ආ) තුවාල කිරීම;

(ඇ) ප්‍රාණ ඇපයට ගැනීම;

(ඈ) පැහැර ගැනීම හෝ අපහරණය කිරීම;

(ඉ) යම් මහජන භාවිත ස්ථානයකට, රාජ්‍ය හෝ ආණ්ඩුවේ පහසුකමකට, යම් පොදු හෝ පෞද්ගලික ප්‍රවාහන පද්ධතියකට හෝ යම් යටිතල පහසුකමකට හෝ පරිසරයට බරපතළ අලාභ හානි සිදු කිරීම;

(ඊ) රාජ්‍ය හෝ පෞද්ගලික දේපළ සම්බන්ධයෙන් කොල්ලකෑමේ, ත්‍රාසද්ග්‍රහණය කිරීමේ හෝ සොරකම් කිරීමේ වරද සිදු කිරීම;

(උ) මහජනතාවගේ හෝ ඉන් යම් කොටසක සෞඛ්‍යය සහ ආරක්ෂාවට බරපතළ අවදානමක් ඇති කිරීම;

(ඌ) යම් ඉලෙක්ට්‍රොනික හෝ ස්වයංක්‍රීය හෝ පරිගණකගත පද්ධතියකට හෝ ජාලයකට හෝ ශ්‍රී ලංකාවට පවරා දී ඇති වසම්වල සයිබර් පරිසරයට හෝ ශ්‍රී ලංකාවට පවරා දී ඇති වසම්වල ලියාපදිංචි වී සිටින වෙබ් අඩවිවලට බරපතළ බාධා ඇති කිරීම හෝ අලාභ හානි සිදු කිරීම හෝ එවැන්නකට මැදිහත් වීම;

(එ) යම් ආගමික හෝ සංස්කෘතික දේපළක් විනාශ කිරීම හෝ එවැනි දේපළකට බරපතළ අලාභ හානි සිදුකිරීම;

(ඒ) සංඥා සම්ප්‍රේෂණයක් සහ වෙනත් යම් සංඛ්‍යාත පදනම් වූ සම්ප්‍රේෂණ පද්ධතියක් ඇතුළුව යම් ඉලෙක්ට්‍රොනික, ඇනලොග්, ඩිජිටල් හෝ වෙනත් රැහැන් සහිත හෝ රැහැන් රහිත සම්ප්‍රේෂණ පද්ධතියකට බරපතළ බාධා ඇති කිරීම හෝ අලාභහානි සිදු කිරීම හෝ ඒ සඳහා මැදිහත් වීම;

(ඔ) නීත්‍යානුකූල අවසරයක් නොමැතිව, තුවක්කු, පීඩාකාරී ආයුධ, වෙඩි බෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය හෝ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරන හෝ භාවිත

කිරීමට අරමුණු කරන යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් හෝ ගිනිගන්නා ද්‍රව්‍ය හෝ මළ බැඳෙන ද්‍රව්‍ය හෝ යම් ජීව විද්‍යාත්මක, රසායනික, විද්‍යුත්, ඉලෙක්ට්‍රොනික හෝ න්‍යෂ්ටික අවියක්, වෙනත් න්‍යෂ්ටික පුපුරණ උපකරණයක්, න්‍යෂ්ටික ද්‍රව්‍යයක් හෝ විකිරණශීලී ද්‍රව්‍යයක් හෝ විකිරණ විමෝචන උපකරණයක් ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, රැස් කිරීම, ලබා ගැනීම, සැපයීම, වෙළෙඳාම් කිරීම, සන්තකයේ තබා ගැනීම හෝ භාවිත කිරීම; හෝ

(ඕ) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විෂය පථය තුළ වරදක් සංස්ථාපනය වන්නා වූ ක්‍රියාවක් සිදු කිරීම.

(3) (2) වන උපවගන්තියේ කාර්යය සඳහා "මහජන භාවිත ස්ථානයක්" යන්නට, අදාළ වේලාවේ දී මහජනතාවට අයිතියක් ලෙස හෝ අන්‍යාකාරයෙන් ප්‍රවේශ වීමට අවසරය ඇති හෝ අවසරය ලද යම් මහා මාර්ගයක් සහ වෙනත් යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් ඇතුළත් වේ.

ත්‍රස්තවාදය පිළිබඳ වරද සඳහා වූ දණ්ඩනය

4. (1) යම් තැනැත්තකු විසින් -

(අ) මරණය සිදු කිරීමේ අරමුණින් යුතුව 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කරනු ලබන සහ එම වරද සිදු කිරීමේ දී වෙනත් තැනැත්තකුගේ මරණය සිදු කරනු ලබන යම් තැනැත්තකුට මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, ජීවිතාන්තය දක්වා සිර දඬුවමෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය;

(ආ) (අ) ඡේදයේ සඳහන් වැරදි නොවන 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ සහිතව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු 3 වන වගන්තිය හෝ 5 වන වගන්තිය යටතේ වන යම් වරදකට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට,-

(අ) ඒ වරදකරු කරනු ලැබීම ප්‍රකාරව, එම වරද සඳහා එම අධිකරණය විසින් පනවනු ලැබිය යුතු දණ්ඩනයට අමතරව අධිකරණය විසින් ඒ තැනැත්තාගේ චංචල සහ නිශ්චල යන දෙවර්ගයටම අයත් සියලු දේපළ රාජ සන්තක කරනු ලැබිය හැකි ය; සහ

(ආ) එසේ වරදකරු කරනු ලැබීමෙන් පසු එම තැනැත්තා විසින් සිදු කරන ලද යම් දේපළ අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් ශූන්‍යව සහ බලරහිතව ඇති ලෙස සහ ශූන්‍ය සහ බලරහිත වන බවට සලකනු ලැබිය යුතු ය.

**ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට තැත් කිරීම සඳහා වූ දණ්ඩනය**

**5.** (1) 3 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට තැත් කරනු ලබන, අනුබල දෙනු ලබන හෝ කුමන්ත්‍රණය කරනු ලබන හෝ 3 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට සූදානමින් යම් ක්‍රියාවක් සිදු කරනු ලබන යම් තැනැත්තකු මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහළොවක් නොඉක්මවනු ලබන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන එකක් නොඉක්මවනු ලබන දඩයකට යටත් විය යුතු ය.

(2) එම තැනැත්තා විසින්, (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කර ඇත්නම්, එම තැනැත්තා ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කර ඇති ලෙස සලකමින්, එම තැනැත්තා ත්‍රස්තවාදය පිළිබඳ වරද සඳහා පනවනු ලබන දණ්ඩනයටම යටත් කරනු ලැබිය යුතු ය.

**තහනම් කළ ත්‍රස්තවාදී සංවිධාන සහ ව්‍යාපාර ආශ්‍රිත වැරදි**

**6.** (1) 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම ස්වකීය අරමුණ වන තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක හෝ ව්‍යාපාරයක -

(අ) නායකයකු, සාමාජිකයකු හෝ සක්‍රිය සාමාජිකයකු ලෙස එකතු වන, කටයුතු කරන හෝ සේවය කරන;

(ආ) ක්‍රියාකාරකම්වලට, ඕනෑම මට්ටමකින් ආධාර කරන හෝ මෙහෙයවන; හෝ

(ඇ) සාමාජිකයකු හෝ සක්‍රිය සාමාජිකයකු ලෙස යම් තැනැත්තකු බඳවා ගන්නා හෝ සාමාජිකයකු වීමට හෝ සක්‍රිය සාමාජිකයකු වීමට යම් තැනැත්තකු පොලඹවා ගන්නා හෝ දිරිගන්වන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම ස්වකීය අරමුණ වන තහනම් කළ ත්‍රස්තවාදී සංවිධානයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ එය වෙනුවෙන් දේපළ කොල්ලකන, ත්‍රාසද්ග්‍රහණය කරන, සොරකම් කරන හෝ මුදල් නැතහොත් යම් දේපළක් හෝ වෙනත් දෙයක් අන්‍යාකාරයකින් ලබා ගන්නා යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

**නිශ්චිතව දක්වනු ලබන ක්‍රියා**

**7.** (අ) මේ පනත යටතේ වන වරදක වින්දිතයකු හෝ මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම පිළිබඳ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ III වන කොටස යටතේ වන වරදක් සිදු කරනු ලබන; හෝ

(ආ) මේ පනතේ 3 වන වගන්තියේ දක්වා ඇති ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම, ඊට සූදානම් වීම හෝ පෙලඹවීම යන කාර්යය සඳහා යම් ද්‍රව්‍යයක් සන්තකයේ තබා ගනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

**ත්‍රස්තවාදය ආශ්‍රිත බරපතළ අපරාධ ක්‍රියා**

**8.** යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බව හෝ එවැනි වරදක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති බව දනිමින් හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී ඒ තැනැත්තාට රැකවරණය දෙන, වසන් කරන හෝ වෙනත් යම් ආකාරයකින් සාවද්‍ය ලෙස හෝ නීත්‍යානුකූල නොවන ලෙස ඒ තැනැත්තා හඳුනා ගැනීම, සිරභාරයට ගැනීම, අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තැබීම වළක්වන, ඊට අවහිර කරන හෝ මැදිහත් වන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

**ත්‍රස්තවාදය ආශ්‍රිත ක්‍රියා**

**9.** වෙනත් තැනැත්තකු විසින්, රහස්‍ය තොරතුරු මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීමට, අනුබල දීමට, තැත් කිරීමට හෝ වරද සිදු කිරීමට භාවිත කරනු ලබන බව දනිමින්ම හෝ ඒ බව විශ්වාස කිරීමට සාධරණ හේතු තිබිය දී -

(අ) එම තොරතුරු එකී වෙනත් තැනැත්තා වෙත සැපයීමේ අදහසින් යම් රහස්‍ය තොරතුරු රැස් කරන; හෝ

(ආ) එකී වෙනත් තැනැත්තා වෙත යම් රහස්‍ය තොරතුරු සපයන,

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය:

එසේ වුව ද, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන්, මහජන යහපත උදෙසා හෝ ජාතික සුබසිද්ධිය පිණිස නිසි උද්‍යෝගය ඇතිව සද්භාවයෙන් කිසිවක් පළ කිරීම හෝ ශාස්ත්‍රීය ප්‍රකාශනයක කිසිවක් පළ කිරීම මේ වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

ත්‍රස්තවාදය දිරිගැන්වීම

**10.** (1) (අ) ජනතාවගෙන් ඇතැමෙක් විසින් හෝ සියලුම ජනතාව විසින් හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඒ සඳහා සූදානම් වීමට හෝ පෙලඹවීමට ඔවුන් සෘජුව හෝ වක්‍රව දිරිගන්වන්නක් හෝ පොලඹවන්නක් ලෙස තේරුම් ගැනීමට ඉඩ ඇති යම් ප්‍රකාශයක් පළ කරන්නා වූ හෝ පළ කිරීමට කටයුතු සලස්වන්නා වූ හෝ එවැනි වචනයක් හෝ වචන කතා කරන්නා වූ හෝ සංඥා හෝ දෘශ්‍ය නිරූපණය සිදු කරන්නා වූ; සහ

(ආ) (i) එමගින් ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඊට සූදානම් වීමට හෝ පෙලඹවීමට ජනතාව සෘජුව හෝ වක්‍රව දිරිගැන්වීමට හෝ පෙලඹවීමට අරමුණු කරන්නා වූ; හෝ

(ii) ඒ ප්‍රකාශයෙන් ජනතාව ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඊට සූදානම් වීමට හෝ පෙලඹවීමට සෘජුව හෝ වක්‍රව දිරිගැන්වෙන්නේ ද නැතහොත් පෙලඹවෙන්නේ ද යන්න පිළිබඳ අනවධානීව සිටින්නා වූ,

තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) මුද්‍රිත මාධ්‍ය;
(ආ) අන්තර්ජාලය;

(ඇ) ඉලෙක්ට්‍රොනික මාධ්‍ය; හෝ

(ඈ) වෙනත් ආකාරයක ප්‍රසිද්ධ දැන්වීමක්,

භාවිත කරමින් ඒ උපවගන්තියේ සඳහන් ප්‍රකාශයක් පළ කරන හෝ පළ කිරීමට කටයුතු සලස්වන යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "ප්‍රකාශය" යන්නට -

(අ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම සඳහා සූදානම් වීම උත්කර්ෂයට නංවන; සහ

(ආ) උත්කර්ෂයට නංවා ඇති ක්‍රියාව උත්කර්ෂයට නංවා ඇත්තේ පවත්නා අවස්ථානුගත කරුණු යටතේ ඔවුන් විසින් අනුකරණය කළ යුතු ක්‍රියාවක් ලෙස යැයි ජනතාව විසින් වටහා ගනු ඇති බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වූ,

සෑම ප්‍රකාශයක්ම ඇතුළත් වන නමුත් සද්භාවයෙන් පළ කරන ලද මතයක්, සද්භාවයෙන් කරන ලද යම් යුක්ති සහගත විවේචනයක්, උපහාසයක්, හාස්‍යමය අනුකරණයක්, විපරමක් හෝ අභියෝගයක් ඇතුළත් නොවේ.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ප්‍රකාශයක් තේරුම් ගැනීමට ඉඩ ඇත්තේ කෙසේ ද යන්න සහ එසේ වටහා ගනු ලැබ ඇති බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැක්කේ ජනතාවගෙන් කවුරුන් ද යන්න -

(අ) සමස්තයක් වශයෙන් ප්‍රකාශයේ අන්තර්ගතය; සහ

(ආ) එය පළ කිරීමට අදාළ අවස්ථානුගත කරුණු සහ එය පළ කරන ලද ආකාරය,

යන කරුණු දෙකම සැලකිල්ලට ගනිමින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ දක්වා ඇති යම් ප්‍රකාශයකින් ඔහුගේ අදහස් ප්‍රකාශ නොවන බව ද, එකී ප්‍රකාශය පළ කිරීමට අදාළ සියලු අවස්ථානුගත කරුණුවල දී එකී පළ කිරීම සඳහා

ඔහුගේ කැමැත්ත හෝ අනුමතය ලබා දී නොමැති බව ද, එකී තැනැත්තා විසින් මහාධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම්, එවැනි යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

ත්‍රස්තවාදී ප්‍රකාශන ව්‍යාප්ත කිරීම

11. (1) යම් තැනැත්තකු විසින් -

(අ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් බෙදා හරිනු ලබන්නේ නම් නැතහොත් සංසරණය කරනු ලබන්නේ නම්;

(ආ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ලබා දෙනු ලබන්නේ නම්, විකුණනු ලබන්නේ නම් හෝ තාවකාලිකව ලබා දෙනු ලබන්නේ නම්;

(ඇ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ නම්;

(ඈ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ලබා ගැනීමට, කියවීමට, සවන් දීමට හෝ බැලීමට හෝ නැතහොත් ත්‍යාග දීමක් හෝ විකිණීමක් මාර්ගයෙන් අත්කර ගැනීමට හැකියාව ලැබෙන යම් සේවාවක් වෙනත් තැනැත්තන්ට සපයනු ලබන්නේ නම්;

(ඉ) ත්‍රස්තවාදී ප්‍රකාශනයක අන්තර්ගත දේ ඉලෙක්ට්‍රොනිකව සම්ප්‍රේෂණය කරනු ලබන්නේ නම්; හෝ

(ඊ) (අ) සහ (ආ) ඡේදවල සඳහන් යම් කාර්යය සඳහා භාවිත කිරීමේ අරමුණින් යුතුව ත්‍රස්තවාදී ප්‍රකාශනයක් තම සන්තකයේ තබා ගනු ලබන්නේ නම්; සහ

ඒ තැනැත්තා විසින් -

(අ) එමගින් ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඊට සූදානම් වීමට හෝ පෙලඹවීමට ජනතාව ඍජුව හෝ වක්‍රව දිරි ගැන්වීමට හෝ පෙලඹවීමට අරමුණු කරනු ලබන්නේ නම්; හෝ

(ආ) එම ප්‍රකාශනයෙන් ජනතාව ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට, ඊට සූදානම් වීමට හෝ පෙලඹවීමට ඍජුව හෝ වක්‍රව දිරි ගැන්වෙන්නේ ද නැතහොත් පෙලඹවෙන්නේ ද යන්න පිළිබඳ අනවධානීව ඇත්නම්,

එම තැනැත්තා මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) මුද්‍රිත මාධ්‍ය;

(ආ) අන්තර්ජාලය;

(ඇ) ඉලෙක්ට්‍රොනික මාධ්‍ය; හෝ

(ඈ) වෙනත් ආකාරයක ප්‍රසිද්ධ දැන්වීමක්,

භාවිත කරමින් ඒ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් යම් ක්‍රියාවක් සිදු කරන යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "ත්‍රස්තවාදී ප්‍රකාශනය" යන්නෙන්, එවැනි ප්‍රකාශන ලබා ගැනීමට ඇති හෝ ලබා ගැනීමට හැකි තැනැත්තන්ගෙන් ඇතැමෙක් හෝ එකී සියලු තැනැත්තන් විසින් එම ප්‍රකාශනය -

(අ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට හෝ ඊට සූදානම් වීමට ඔවුන් ඍජුව හෝ වක්‍රව දිරි ගන්වන්නක් ලෙස හෝ ඒ සඳහා වන පොලඹවන්නක් ලෙස; හෝ

(ආ) එහි සඳහන් කාරණය ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට හෝ ඊට සූදානම් වීමට උපකාරී වන බවට,

තේරුම් ගනු ලබන යම් ප්‍රකාශනයක් අදහස් වේ.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා "කාරණය" යන්නට -

(අ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම සඳහා සූදානම් වීම උත්කර්ෂයට නංවන; සහ

(ආ) උත්කර්ෂයට නංවා ඇති ක්‍රියාව උත්කර්ෂයට නංවා ඇත්තේ පවත්නා අවස්ථානුගත

කරුණු යටතේ ඔවුන් විසින් අනුකරණය කළ යුතු ක්‍රියාවක් ලෙස යැයි ජනතාව විසින් වටහා ගනු ඇති බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි වූ,

සෑම කරුණක්ම ද ඇතුළත් වේ.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා යම් ප්‍රකාශනයක් ත්‍රස්තවාදී ප්‍රකාශනයක් ද යන්න සලකා බැලීම සඳහා පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය :-

(අ) සමස්තයක් වශයෙන් එකී ප්‍රකාශනයේ අන්තර්ගතය; සහ

(ආ) ඒ ප්‍රකාශනයේ ප්‍රතිඵලයක් ලෙස යම් නිශ්චිත ක්‍රියාවක් සිදු කර ඇති අවස්ථාවක, ඊට අදාළ අවස්ථානුගත කරුණු.

(6) ත්‍රස්තවාදී ප්‍රකාශනයක් යැයි කියනු ලබන ප්‍රකාශනයක ඇතුළත් කරුණුවලින් යම් තැනැත්තකුගේ අදහස් ප්‍රකාශ නොවන බව ද, එකී ප්‍රකාශනය පළ කිරීමට අදාළ සියලු අවස්ථානුගත කරුණුවල දී ඊට ඔහුගේ කැමැත්ත හෝ අනුමතය ලබා දී නොමැති බව ද, එකී තැනැත්තා විසින් මහාධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන්නේ නම්, තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා -

"තාවකාලික ලබාදීම" යන්නට, කුලියට දීම ද ඇතුළත් වේ;

"ප්‍රකාශනය" යන්නෙන්, පහත දැක්වෙන කරුණු කිසිවක් ඇතුළත්, ඕනෑම විස්තරයක් සහිත දෙයක් හෝ වාර්තාවක් අදහස් වේ:-

(අ) කියවීම සඳහා වන කරුණු;

(ආ) සවන් දීම සඳහා වන කරුණු; හෝ

(ඇ) බැලීම හෝ නැරඹීම සඳහා වන කරුණු.

**12.** (1) යම් තැනැත්තකු විසින් -

ත්‍රස්තවාදය සඳහා පුහුණු වීම

(අ) 3 වන වගන්තිය යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම සඳහා නැතහොත් ඊට සූදානම් වීම සඳහා හෝ එකී ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට නැතහොත් ඊට සූදානම් වීමට සහාය වීම සඳහා උපදෙස් හෝ පුහුණුව ලබා දෙන්නේ නම්; සහ

(ආ) එකී උපදෙස් හෝ පුහුණුව ලබාගන්නා තැනැත්තා විසින්, ඔහු එකී උපදෙස් හෝ පුහුණුව ලබන්නේ යම් නිපුණතා සම්බන්ධයෙන් ද, එම නිපුණතා -

(i) මේ පනත යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම නැතහොත් ඊට සූදානම් වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන්; හෝ

(ii) මේ පනත යටතේ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට නැතහොත් ඊට සූදානම් වීමට සහාය වීම සඳහා,

භාවිත කිරීමට අරමුණු කරන බව හෝ භාවිත කිරීමට ඉඩ ඇති බව ඔහු විසින් එකී උපදෙස් හෝ පුහුණුව ලබා දෙන අවස්ථාවේ දී දන්නේ නම්,

එම තැනැත්තා මේ වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් -

(අ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම සඳහා නැතහොත් ඊට සූදානම් වීම සඳහා හෝ ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට නැතහොත් ඊට සූදානම් වීමට සහාය වීම සඳහා උපදෙස් හෝ පුහුණුව ලබා ගන්නේ නම්; සහ

(ආ) එකී උපදෙස් හෝ පුහුණුව ලබා ගන්නා

අවස්ථාවේ දී, ඔහු එකී උපදෙස් හෝ පුහුණුව ලබා ගන්නේ යම් නිපුණතා සම්බන්ධයෙන් ද, එම නිපුණතා -

(i) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීම නැතහොත් ඊට සූදානම් වීම සඳහා හෝ ඒ හා සම්බන්ධයෙන් භාවිත කිරීමට අරමුණු කරන්නේ නම්; හෝ

(ii) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමට නැතහොත් ඊට සූදානම් වීමට වෙනත් තැනැත්තකුට සහාය වීම සඳහා භාවිත කිරීමට අරමුණු කරන්නේ නම්,

එම තැනැත්තා 6 වන වගන්තිය යටතේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "උපදෙස් හෝ පුහුණුව" යන්නෙන්,-

(අ) තුවක්කු, පුපුරණ ද්‍රව්‍ය හෝ රසායනික, ජීව විද්‍යාත්මක හෝ න්‍යෂ්ටික ආයුධ සෑදීම සඳහා හෝ භාවිත කිරීම; හෝ

(ආ) ත්‍රස්තවාදය පිළිබඳ වරද සිදු කිරීමේ කාර්යය සඳහා හෝ ඒ හා සම්බන්ධයෙන් යම් දෙයක් කිරීම සඳහා වූ යම් ක්‍රමවේදයක් හෝ ශිල්ප ක්‍රමයක් භාවිත කිරීම, සැලසුම් කිරීම හෝ යොදා ගැනීම,

සම්බන්ධයෙන් වන උපදෙස් හෝ පුහුණුව අදහස් වේ.

**6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති යටතේ වන වැරදි සිදු කිරීම සඳහා වන දණ්ඩනය**

13. (1) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති යටතේ වන යම් වරදක් සිදු කරන යම් තැනැත්තකු, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහළොවක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති යටතේ වන යම් වරදකට වරදකරු කරනු ලැබූ විට, (1) වන උපවගන්තිය යටතේ එකී තැනැත්තාට පනවනු ලබන යම් දණ්ඩනයකට අමතරව, එම තැනැත්තා සන්තකයේ ඇත්තා වූ ද, එම වරද සිදු කිරීමට අදාළ බවට මහාධිකරණය විසින් සලකනු ලබන්නා වූ ද, යම් චංචල හෝ නිශ්චල දේපළක් ජනරජය වෙත රාජසන්තක කිරීම සඳහා මහාධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති යටතේ වන වැරදි සිදු කිරීමට තැත් කිරීම යනාදිය සඳහා වන දණ්ඩනය

**14.** (1) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන සහ 12 වන වගන්ති යටතේ වන යම් වරදක් සිදු කිරීමට තැත් කරන, අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කරන හෝ එම වගන්ති යටතේ වන යම් වරදක් සිදු කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් සිදු කරන යම් තැනැත්තකු, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයක් නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(2) 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන හෝ 12 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති යම් වරදක් එම වරද සිදු කිරීමට තැත් කිරීමේ, අනුබල දීමේ හෝ කුමන්ත්‍රණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු කර ඇත්නම් හෝ එම වරද සිදු කිරීමට සූදානම් වීමේ යම් ක්‍රියාවක් සිදු කර ඇත්නම්, ප්‍රතිඵලයක් වශයෙන් වරදකරු එම වරද සිදු කර ඇති ලෙස සලකමින්, එම දණ්ඩනයට ම යටත් විය යුතු ය.

තොරතුරු සැපයීම පැහැර හැරීම වරදක් බව

**15.** (අ) (i) වෙනත් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට; හෝ

(ii) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට සූදානම් වන බවට, තැත් කරන බවට, අනුබල දෙන බවට හෝ කුමන්ත්‍රණය කරන බවට,

දනිමින් හෝ එසේ විශ්වාස කිරීමට හේතු තිබිය දී, ඒ පිළිබඳ ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයාට වාර්තා කිරීම පැහැර හරින; හෝ

(ආ) ත්‍රස්තවාදය පිළිබඳ වරද හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වරදක් සිදු කර ඇති බවට ඔහු දන්නා යම් තැනැත්තකු සිටින ස්ථානය සම්බන්ධයෙන් වන තොරතුරු තම සන්තකයේ තිබිය දී ඒ තොරතුරු පොලිස් නිලධරයකුට සැපයීම පැහැර හරින හෝ එම පොලිස් නිලධරයාට අසත්‍ය හෝ නොමඟ යවන සුලු තොරතුරු සපයන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු හතක් නොඉක්මවන කාලසීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

නීත්‍යානුකූල නියම නොපිළිපැදීම වරදක් බව

**16.** (අ) මේ පනත ප්‍රකාර කරන ලද නීත්‍යානුකූල විධානයක් හෝ නියමයක් කඩ කරන හෝ උල්ලංඝනය කරමින් ක්‍රියා කරන;

(ආ) මේ පනත ප්‍රකාර කරන ලද විධානයකට අනුකූලව ක්‍රියා කිරීම සිතාමතාම පැහැර හරින හෝ නොසලකා හරින;

(ඇ) මේ පනත යටතේ විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයකුට තොරතුරු ලබා දීම පැහැර හරින හෝ එවැනි නිලධරයකු අසන ප්‍රශ්නයකට පිළිතුරු ලෙස අසත්‍ය හෝ නොමඟ යවන සුලු තොරතුරු ලබා දෙන:

එසේ වුව ද, එවැනි යම් තැනැත්තකු චෝදනාවකට හසු කර ගනු ලබන ආකාරයට මේ ඡේදය යටතේ ප්‍රකාශයක් ලබාදෙන ලෙස එම තැනැත්තාට බලකිරීමක් සිදු කරනු නොලැබිය යුතු ය;

(ඈ) මේ පනත යටතේ නිකුත් කරන ලද නීත්‍යානුකූල නියමයක් හෝ විධානයක් ක්‍රියාත්මක කිරීම හිතාමතාම වළක්වන හෝ ඊට බාධා කරන; හෝ

(ඉ) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම වළක්වන හෝ ඊට බාධා කරන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමට සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

වැරදි, සංඥෙය වැරදි විය යුතු බව

**17.** මේ පනත යටතේ වූ යම් වරදක් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් විය යුතු අතර, මේ පනතේ, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සහ වෙනත් අදාළ ලිඛිත නීතිවල විධිවිධාන ප්‍රකාර විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ දඬුවම් පැනවීම කළ යුතු ය.

## III වන කොටස

## වැරදි විමර්ශනය කිරීම

විමර්ශන පැවැත්විය හැකි වන්නේ කවුරුන් විසින් ද යන්න

**18.** (1) මේ පනත යටතේ වන වරදක් පිළිබඳව හෝ මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට සූදානම් වීමේ ක්‍රියාවක් පිළිබඳ විමර්ශනය ආරම්භ කර පවත්වා ගෙන යාමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකුට හෝ පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් බලය දෙන ලද වෙනත් යම් පොලිස් නිලධරයකුට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකු ඉදිරිපිට දී මේ පනත යටතේ වන වරදක් සිදු කරන අවස්ථාවක දී හෝ වරදක් සිදු කර ඇති බවට සැක කරන යම් තැනැත්තකු ඒ වරද සිදු කිරීමෙන් ඉක්බිතිව ම සිරභාරයට ගන්නා අවස්ථාවක දී, යම් පොලිස් නිලධරයකු විසින් ඒ තැනැත්තා සිරභාරයට ගෙන ප්‍රශ්න කිරීම සහ විමර්ශනය ආරම්භ කිරීම නීත්‍යානුකූල විය යුතු ය:

එසේම තවදුරටත්, ඒ පොලිස් නිලධරයා විසින් ඒ විමර්ශනය ආරම්භ කිරීම පිළිබඳ අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට වහාම දැනුම් දී ඔහුගේ උපදෙස්වලට යටත්ව විමර්ශනය පවත්වනු ලැබිය යුතු ය.

**පොලිස් නිලධරයකු සහ වෙනත් නිලධරයන් විසින් සිරභාරයට ගැනීම**

**19.** යම් පොලිස් නිලධරයකු, යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් -

(අ) මේ පනත යටතේ වන වරදක් ඔහු ඉදිරිපිට දී සිදු කරන හෝ මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට හෝ මේ පනත යටතේ වන වරදක් ඒ තැනැත්තා විසින් සිදු කිරීමට අත්‍යාසන්න හැකියාවක් පවතින බවට විශ්වාස කිරීමට ඔහුට සාධාරණ සැකයක් ඇති යම් තැනැත්තකු;

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති යම් තැනැත්තකු;

(ඇ) මේ පනත යටතේ වන වරදක් කර ඇති බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වී ඇති බවට ඔහු විශ්වාස කරන පරිදි විශ්වසනීය වන තොරතුරක් හෝ පැමිණිල්ලක් ඒ පොලිස් නිලධරයා, සන්නද්ධ හමුදා සාමාජිකයා හෝ වෙරළ ආරක්ෂක නිලධරයා වෙත ලැබෙන්නේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද, එවැනි යම් තැනැත්තකු;

(ඈ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමෙන් පසුව සිරභාරයට ගැනීම මඟ හැරීමේ අරමුණින් ශ්‍රී ලංකාවෙන් පලා යන තැනැත්තකු හෝ සිරභාරයට ගැනීම මඟ හරින යම් තැනැත්තකු; හෝ

(ඉ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සැකකරුවකු වී සිටින්නා වූ යම් තැනැත්තකු මුදාහරිනු ලැබ ඇත්තේ යම් ඇප කොන්දේසිවලට යටත්ව ද, ඒ ඇප කොන්දේසි උල්ලංඝනය කරන එවැනි තැනැත්තකු,

වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි ය.

**පොලිස් නිලධරයකු නොවන නිලධරයකු විසින් සිරභාරයට ගැනීම සිදු කරනු ලබන විට ක්‍රියා පටිපාටිය**

**20.** (1) පොලිස් නිලධරයකු නොවන යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් සිරභාරයට ගත් තැනැත්තකු, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව සහ කවර අවස්ථාවක දී වුව ද පැය විසිහතරක් නොඉක්මවන කාලසීමාවක් තුළ ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ

පොලිස්පතිවරයා විසින් තත්කාර්යය සඳහා, කලින් කල, නම් කරනු ලබන පොලිස් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ශ්‍රී ලංකා ජනරජයේ දේශයෙන් බැහැර දී හෝ යම් ගුවන් යානයක දී හෝ යාත්‍රාවක දී ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබ ඇති අවස්ථාවක දී, සිරභාරයට ගත් ඒ ස්ථානයේ සිට අදාළ පොලිස් ස්ථානයට ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලය ඒ පැය විසිහතරේ කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත මේ උපවගන්තියේ පෙරාතුව වූ විධිවිධාන ප්‍රකාර සිරභාරයට ගනු ලැබූ තැනැත්තා ඉදිරිපත් කිරීම, එකී සිරභාරයට ගැනීම සිදු කරන ලද තැනැත්තාගේ පාලනයෙන් බැහැර හේතු නිසා ප්‍රායෝගික නොවන්නේ නම්, ඒ තැනැත්තා ඊළඟට ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයාගේ භාරයට පත් කරනු ලැබිය යුතු ය.

(2) සිරභාරයට ගැනීම සිදු කරන ලද නිලධරයා විසින්, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, එකී සිරභාරයට ගැනීම පිළිබඳව ඒ තොරතුරු ලබාගැනීමට බලය දී ඇති අධිකාරීලත් නිලධරයකුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) 24 වන සහ 25 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකුගේ ජීවිතය ආරක්ෂා කිරීම, ත්‍රස්තවාදී ක්‍රියාවක් වැළැක්වීම හෝ මේ පනත යටතේ සිදු කරන ලද වරදකට අදාළ සාක්ෂි සංරක්ෂණය කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී, අධිකාරීලත් නිලධරයකු විසින් එසේ සිරභාරයට ගත් තැනැත්තෙකුගේ ප්‍රශ්න කිරීම සහ වැඩිදුරටත් සෝදිසි කිරීම කරනු ලැබිය හැකි ය.

(4) ඒ අධිකාරීලත් නිලධරයා විසින් නොපමාව ඒ සිරභාරයට ගැනීම පිළිබඳව ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයාට හෝ තත්කාර්යය සඳහා පොලිස්පතිවරයා විසින් නම් කරන ලද පොලිස් නිලධරයකුට හෝ දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි පොලිස් ස්ථානය භාර නිලධරයාගේ අත්අඩංගුවට එසේ සිරභාරයට ගත් තැනැත්තා පත් කරනු ලබන වේලාවේ දී, ඒ සිරභාරයට ගැනීම සිදු

කරන ලද නිලධරයා විසින්, ඒ පොලිස් ස්ථානය භාර නිලධරයාට ඔහු විසින් කරන ලද සිරභාරයට ගැනීමට අදාළ අවස්ථානුගත කරුණු දක්වමින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(6) ඒ නිලධරයා විසින් සැකකරුගේ සන්තකයේ තිබී සොයා ගනු ලැබූ හෝ සිරභාරයට ගන්නා ස්ථානයේ තිබී සොයා ගනු ලැබූ සියලු අයිතම ඒ පොලිස් ස්ථානය භාර නිලධරයාට භාර දීම ද සිදු කරනු ලැබිය යුතු ය.

සිරභාරයට ගැනීම පොලිස් නිලධරයකු විසින් කරනු ලැබූ විට ක්‍රියාපටිපාටිය

**21.** (1) (අ) පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු නොපමාව ඒ පොලිස් නිලධරයා අනුයුක්තව සිටින පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, සිරභාරයට ගනු ලැබූ තැනැත්තා ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ප්‍රකාර සිරභාරයට ගැනීමක් සිදු කිරීමට හෝ සිරභාරයට ගනු ලැබූ තැනැත්තකු පොලිස් ස්ථානයකට ගෙන යාමට යම් සන්නද්ධ හමුදා සාමාජිකයකුගේ හෝ වෙරළ ආරක්ෂක නිලධරයකුගේ සහාය පොලිස් නිලධරයකු විසින් ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

නතර කිරීමේ සහ සෝදිසි කිරීමේ බලය

**22.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතින අවස්ථාවක දී, (මේ කොටසේ මින් මතු "සිරභාරයට ගන්නා නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පොලිස් නිලධරයකු, යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු විසින්,-

(අ) යම් තැනැත්තකු, වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක් හෝ ගුවන් යානයක් නැවැත්වීම සහ සෝදිසි කිරීම;

(ආ) යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම;

(ඇ) යම් පරිශ්‍රයකට හෝ ඉඩමකට ඇතුළු වීම සහ සෝදිසි කිරීම; සහ

(ඈ) මේ පනත යටතේ වන යම් වරදක් සිදුකිරීමේ දී භාවිත කරනු ලැබූ, ඉන් ව්‍යුත්පන්න වූ, ඊට සම්බන්ධ වූ හෝ ඒ සඳහා සම්බන්ධතාවක් දක්වන හෝ එවැනි

වරදක් සිදු කිරීමේදී සඳහා භාවිත කරනු ලැබූ බවට, ඉන් ව්‍යුත්පන්න වූ බවට, ඊට සම්බන්ධ වූ බවට හෝ ඒ සඳහා සම්බන්ධතාවක් දක්වන ලද බවට සාධාරණ ලෙස සැක කරනු ලබන යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ස්වකීය භාරයට ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ අදාළ පාර්ශ්වයන් වෙත දැනුම් දීමක් නිකුත් කිරීමට අදාළ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 26 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) එසේ භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් අදාළ පොලිස් නිලධරයා අනුයුක්ත කර ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත හෝ ආසන්නත ම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ දක්වා ඇති පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, අදාළ සැකකරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී මහෙස්ත්‍රාත්වරයා විසින්, එසේ භාරයට ගනු ලැබූ යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් සන්තකයෙහි තබා ගැනීම හෝ මුදා කිරීම සම්බන්ධයෙන් උචිත ආඥාවක් කරනු ලැබිය යුතු ය.

සිරභාරයට ගනු ලබන අවස්ථාවේ දී ලබාදිය යුතු තොරතුරු

**23.** (1) සිරභාරයට ගැනීම සිදු කරනු ලබන අවස්ථාවේ දී, සිරභාරයට ගන්නා නිලධරයා විසින්, (මේ කොටසේ මින් මතු "සැකකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) සිරභාරයට ගනු ලබන තැනැත්තා වෙත -

(අ) සිරභාරයට ගන්නා නිලධරයාගේ අනන්‍යතාව;

(ආ) සැකකරු විසින් සිදු කර ඇතැයි කියනු ලබන වරද;

(ඇ) ලිඛිත නීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි නීතිඥවරයකු මුණගැසීම සඳහා සැකකරුට ඇති අයිතිවාසිකම,

සම්බන්ධයෙන් තොරතුරු ලබා දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා අතුරින් සැකකරුට අවබෝධ වන කවර හෝ භාෂාවකින් ලබාදීම සඳහා සෑම සාධාරණ පියවරක්ම ගනු ලැබිය යුතු ය.

(3) සිරභාරයට ගන්නා වේලාවේ දී (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි සැකකරුට එකී තොරතුරු ලබාදීම ප්‍රායෝගික නොවන අවස්ථාවක දී, එකී තොරතුරු ඔහුට අවබෝධ වන යම් භාෂාවකින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ලබා දෙනු ලැබිය යුතු ය.

සිරභාරයට ගැනීම පෞද්ගලිකත්වය කෙරෙහි නිසි සැලකිල්ල දක්වමින් කරනු ලැබිය යුතු බව

**24.** සෑම සිරභාරයට ගැනීමක් ම සැකකරුගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වමින් සිදු කරනු ලැබිය යුතු ය. සැකකාර ස්ත්‍රියක් සිරභාරයට ගැනීමේ දී සිරභාරයට ගන්නා නිලධාරිනියක විසින් එය සිදු කරනු ලැබීමට හෝ නිලධාරිනියක ඉදිරිපිට දී එය සිදු කරනු ලැබීමට වගබලා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය.

ස්ත්‍රීන් සෝදිසි කිරීම සහ ස්ත්‍රීන්ගෙන් ප්‍රශ්න කිරීම

**25.** (1) යම් සැකකාර ස්ත්‍රියකගෙන් ප්‍රශ්න කිරීම සිරභාරයට ගන්නා නිලධාරිනියක විසින් සිදු කරනු ලැබීමට හෝ නිලධාරිනියක ඉදිරිපිට දී සිදු කරනු ලැබීමට වගබලා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය.

(2) යම් සැකකාර ස්ත්‍රියක් සෝදිසි කිරීම අනිවාර්යයෙන්ම නිලධාරිනියක විසින් සිදු කළ යුතු ය.

සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම් දීම

**26.** (1) යම් තැනැත්තකු 20 වන හෝ 21 වන වගන්තිය යටතේ සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී, එසේ සිරභාරයට ගත් බව පිළිගනිමින් වහාම හෝ කවර විටක දී වුව ද, සිරභාරයට පත් වූ අවස්ථාවේ සිට පැය විසිහතරක් පසු නොවන කාලයක් තුළ දී එම තැනැත්තාගේ කලත්‍රයාට, පියාට, මවට හෝ වෙනත් ළඟම ඥාතියකුට පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව වූ ලියවිල්ලක් ආකාරයෙන් වූ දැනුම් දීමක් නිකුත් කිරීම සිරභාරයට ගන්නා නිලධරයාගේ කාර්යය විය යුතු ය. එකී සිරභාරයට ගනු ලබන තැනැත්තා අත්අඩංගුවෙන් මුදා හරිනු ලබන අවස්ථාවේදී ඒ ලියවිල්ල නිසි බලධරයා වෙත ආපසු භාරදීම හෝ නිසි බලධරයා වෙත ඉදිරිපත් කිරීම එකී ලියවිල්ල දරන තැනැත්තාගේ කාර්යය විය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු අත්අඩංගුවට ගෙන ඇත්තා වූ ද, මේ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ ලියවිල්ලක් නිකුත් කිරීමට නොහැකි වූ ද අවස්ථාවක, සිරභාරයට ගන්නා නිලධරයා පොලිස් නිලධරයකු නම්, එකී ලියවිල්ල නිකුත් කිරීමට නොහැක්කේ මන්ද යන්න පිළිබඳ හේතු දක්වමින් තොරතුරු සටහන් පොතේ සටහනක් ඇතුළත් කිරීම එම පොලිස් නිලධරයාගේ කාර්යය විය යුතු ය. සිරභාරයට ගන්නා නිලධරයා සන්නද්ධ හමුදා සාමාජිකයකු නම් හෝ වෙරළ ආරක්ෂක නිලධරයකු නම්, එකී ලියවිල්ල නිකුත් කිරීමට නොහැක්කේ මන්ද යන්න පිළිබඳ හේතු පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත වාර්තා කිරීම එකී සන්නද්ධ හමුදා සාමාජිකයාගේ හෝ වෙරළ ආරක්ෂක නිලධරයාගේ කාර්යය විය යුතු අතර, එකී පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඒ සඳහා වූ හේතු ද සමග ඒ පිළිබඳව, තොරතුරු සටහන් පොතේ සටහනක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(2) එකී දැනුම්දීමෙහි -

(අ) සිරභාරයට ගැනීම සිදු කළ දිනය, වේලාව සහ ස්ථානය;

(ආ) සිරභාරයට ගැනීමට හේතු;

(ඇ) අත්අඩංගුවේ තබා ගනු ලබන හෝ රඳවා තබනු ලබන ස්ථානය;

(ඈ) සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනා ගැනීමේ අංකය සහ නිලය ; සහ

(ඉ) විමර්ශන පැවැත්වීමට අගතියක් නොමැතිව, සැකකරුගේ ළඟම ඥාතියාට ඔහු වෙත ප්‍රවේශ වීමට යුක්තිසහගත ලෙස අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු නොසිටී නම්, (1) වන උපවගන්තියේ සඳහන් දැනුම් දීම භාරදිය යුතු වන්නා වූ යම් තැනැත්තකුගේ අනන්‍යතාවය සහ එම තැනැත්තා සිටින තැන සම්බන්ධයෙන් සිරභාරයට ගන්නා නිලධරයා විසින් එම සැකකරුගෙන් විමසනු ලැබිය යුතු අතර,

සැකකරු විසින් එකී තොරතුරු ලබා දෙන්නේ නම්, එම දැනුම් දීම එකී තැනැත්තා වෙත භාරදීම සඳහා හැකි සෑම පියවරක්ම ගනු ලැබිය යුතු ය. එකී දැනුම් දීමෙහි පිටපතක් සැකකරුට භාර දෙනු ලැබිය යුතු ය.

(4) සැකකරු රඳවා තබා ගනු ලබන්නා වූ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් සහ කවර අවස්ථාවකදී වුව ද එකී තැනැත්තා සිරභාරයට ගැනීමෙන් පසුව පැය විසිහතරක් ඉකුත්වීමට පෙර ද, එම සිරභාරයට ගැනීම සහ රඳවා තැබීම සම්බන්ධයෙන් දෙවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර, තුන්වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව, පොලිස්පතිවරයා වෙත හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) එකී දැනුම් දීමෙහි -

(අ) සිරභාරයට ගැනීම සිදු කළ දිනය, වේලාව සහ ස්ථානය;

(ආ) සිරභාරයට ගැනීමට හේතු;

(ඇ) සැකකරු රඳවා තබා ගනු ලබන ස්ථානය;

(ඈ) සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනා ගැනීමේ අංකය සහ නිලය;

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සැකකරු වෙත ඉක්මණින් ප්‍රවේශවීමට හැකි කරවනු ලබන වෙනත් යම් තොරතුරු; සහ

(ඊ) එකී සිරභාරයට ගැනීමෙන් සහ රඳවා තැබීමෙන් එකී සැකකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්තේ ද යන්න නිශ්චය කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිය හැකි වෙනත් යම් තොරතුරු,

ඇතුළත් විය යුතු ය.

මධ්‍යගත දත්ත ගබඩාව හා රෙජිස්ටරය

**27.** (1) පොලිස්පතිවරයා විසින්, මේ පනත යටතේ සිදු කළ එක් එක් සිරභාරයට ගැනීම, රඳවා තැබීම, රිමාන්ඩ් භාරයේ තැබීම, ඇප ලබා දීම, නිදහස් කිරීම, නඩු පැවරීම, වරදකරු කිරීම හෝ නිදොස් කිරීම සහ දඬුවම් ලබාදීම සම්බන්ධයෙන් වන තොරතුරු අඩංගු වන මධ්‍යගත දත්ත ගබඩාවක් සහ රෙජිස්ටරයක් ස්ථාපනය කොට පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) එකී දත්ත ගබඩාවේ සහ රෙජිස්ටරයේ -

(අ) සැකකරු සිරභාරයට ගැනීමේ, අත්අඩංගුවෙහි තබා ගැනීමේ සහ රඳවා තැබීමේ නීත්‍යානුකූලභාවය;

(ආ) සැකකරුගේ නිදහස අහිමි කිරීමේ නීත්‍යානුකූලභාවය; සහ

(ඇ) අඛණ්ඩව රඳවා තැබීමේ සහ රිමාන්ඩ් භාරයේ තැබීමේ අවශ්‍යතාවය,

නිශ්චය කිරීම සඳහා අවශ්‍ය වෙනත් යම් තොරතුරු ද ඇතුළත් විය යුතු ය.

(3) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන කවර හෝ අවස්ථාවක දී, පොලිස්පතිවරයා විසින් සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ අනන්‍යතාවය, සිරභාරයට ගනු ලැබූ දිනය, සිරභාරයට ගැනීමට හේතුව, රඳවා තැබීමේ ස්ථානය සම්බන්ධයෙන් එකී දත්ත ගබඩාවේ සහ රෙජිස්ටරයේ ඇතුළත් තොරතුරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සපයනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ලබා ගත් තොරතුරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේ කාර්ය සඳහා පමණක් භාවිත කළ යුතු ය.

මහෙස්ත්‍රාත්-වරයකු වෙත ඉදිරිපත් කිරීම.

**28.** (1) (අ) මේ පනත ප්‍රකාර පොලිස් නිලධරයකු විසින් සිරභාරයට ගෙන රඳවා තබා ගෙන ඇත්තා වූ; හෝ

(ආ) 20 වන වගන්තිය ප්‍රකාර පොලිස් නිලධරයකු නොවන නිලධරයකු විසින් සිරභාරයට ගෙන පොලිස් ස්ථානය භාර නිලධරයකු වෙත හෝ

නම් කරන ලද පොලිස් නිලධරයකු වෙත ඉදිරිපත් කර ඇත්තා වූ,

සැකකරුවකු එකී සිරභාරයට ගැනීම සිදු කළ වේලාවේ සිට පැය හතළිස් අටක් පසු නොවන කාලයක් තුළ දී, ආසන්නතම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සිරභාරයට ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ දේශය තුළ දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සිරභාරයට ගන්නා ලද ස්ථානයේ සිට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව, එම පැය හතළිස් අට ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, සිරභාරයට ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ දේශයෙන් පිටත දී හෝ යම් ගුවන් යානයක දී හෝ යාත්‍රාවක දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, සිරභාරයට ගන්නා ලද ස්ථානයේ සිට අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත ගමන් කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව, එම පැය හතළිස් අට ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය.

(2) සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාව වන විට -

(අ) 31 වන වගන්තිය ප්‍රකාර රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබ එය මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂා කිරීම සඳහා ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එම රඳවා තැබීමේ නියමය බලාත්මක කිරීම සඳහා ආඥාවක් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) රඳවා තැබීමේ නියමයක් නිකුත් කොට නොමැති විට දී හෝ එවැනි රඳවා තැබීමේ නියමයක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කොට නොමැති විට දී, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(i) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීම සඳහා ආඥාවක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන්නේ නම්, අවස්ථානුගත කරුණු අනුව සාධාරණ බවට එකී මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන හේතුන් මත පදනම්ව, සැකකරු රිමාන්ඩ් භාරයේ තබන ලෙස ආඥා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි සාධාරණ හේතු කිසිවක් නොමැති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, සැකකරු ඇප මත නිදහස් කරනු ලැබිය හැකි ය; හෝ

(ii) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, ඇප ලබා දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම් හෝ ඇප ලබා දීමට කිසිදු විරෝධයක් දක්වනු නොලබන්නේ නම්, එකී මහෙස්ත්‍රාත්වරයා විසින් සඳහන් කරනු ලැබිය යුතු කොන්දේසි මත, 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන යටතේ සැකකරු ශරීර ඇප හැර වෙනත් ඇප මත මුදා හරිනු ලැබිය හැකි ය; හෝ

(iii) මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන යම් හේතුවක් මත අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එසේ ඉල්ලා සිටින්නේ නම්, සැකකරු නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) සැකකරු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) පෞද්ගලිකව සැකකරු හමුවී, පුද්ගලික සාකච්ඡාවක් මගින් ඔහුගේ යහපැවැත්ම සහ සුබසිද්ධිය පිළිබඳව සොයා බැලීම; සහ

(ආ) සැකකරු විසින් කරනු ලබන යම් අදහස් දැක්වීමක් වාර්තා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "පුද්ගලික සාකච්ඡාව" යන්නෙන්, විවෘත අධිකරණයේ දී හෝ මහෙස්ත්‍රාත්වරයාගේ නිලමැදිරියෙහි දී පවත්වනු ලබන්නා වූ ද, සිරභාරයට ගැනීමට සහභාගී වූ හෝ සැකකරු විසින් සිදු කර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් විමර්ශනය කරන ලද, යම් පොලිස් නිලධරයකු නොමැතිව සිදු කරනු ලබන්නා වූ ද, නඩු කටයුතු අදහස් වේ.

මහෙස්ත්‍රාත්-වරයා විසින් සැකකරු වෝහාරික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරන ලෙස විධාන කළ යුතු බව

**29.** (1) 28 වන වගන්තිය යටතේ සැකකරු විසින් කරන ලද යම් අදහස් දැක්වීමක් සහ සිරභාරයට ගන්නා නිලධරයා විසින් හෝ අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් කරන ලද යම් කරුණු ඉදිරිපත් කිරීමක් සැලකිල්ලට ගැනීමෙන් පසු, සැකකරු කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමකට හෝ වධහිංසාවලට භාජනය වී ඇති බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) සැකකරු වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලෙස සහ එකී අධිකරණ වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ද විධාන කරනු ලැබිය යුතු ය; සහ

(ආ) සැකකරු රඳවා තබා ඇති ස්ථානය වෙනස් කරන ලෙස,

ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) අධිකරණ වෛද්‍ය නිලධරයාගේ වාර්තාවෙන් සැකකරු වධහිංසාවලට භාජනය වී තිබීමට ඉඩ ඇති බව හෙළිදරව් වන අවස්ථාවක, සැකකරුට සහ සිරභාරයට ගන්නා නිලධරයාට හෝ පොලිස් ස්ථානය භාර නිලධරයාට කරුණු දැක්වීම සඳහා අවස්ථාව ලබාදීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) සැකකරු අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම; සහ

(ආ) සැකකරු රිමාන්ඩ් භාරයේ තැබීමට හෝ රඳවා තැබීමට ආඥා කිරීම,

කරනු ලැබිය යුතු ය.

(3) සැකකරු රිමාන්ඩ් භාරයේ තබන ලෙස හෝ රඳවා තබන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලබන අවස්ථාවක දී, කලින් සැකකරු වෙත ප්‍රවේශ වීමට හැකියාව තිබූ යම් පොලිස් නිලධරයකුට සැකකරු වෙත ප්‍රවේශ වීමට නොහැකි විය යුතු ය.

(4) එකී සැකකරු සම්බන්ධයෙන් වන විමර්ශනය පොලිස්පතිවරයා විසින් විධාන කරනු ලබන පරිදි වෙනත් යම් පොලිස් නිලධරයන් විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(5) වධහිංසා සිදු කරන ලද බවට චෝදනා ලද තැනැත්තාට විරුද්ධව අපරාධ නඩු කටයුතු පැවරීමට නීතිපතිවරයාට හැකි කරවීම සඳහා, කරන ලදැයි කියනු ලබන වධහිංසා සිදු කිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයාට විධාන කරනු ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයේ තැබිය හැකි උපරිම කාලසීමාව

**30.** (1) අපරාධ නඩු කටයුතු පැවරීමෙන් තොරව කිසිම තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ දිනයේ සිට වසරක් ඉක්මවන කාලසීමාවක් සඳහා රිමාන්ඩ් භාරයේ නොතැබිය යුතු ය:

එසේ වුව ද, නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් කරන ලද ආඥාවකින් රිමාන්ඩ් භාරයේ තබන කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි අතර, කිසිදු විටක දී, එකී කාලසීමාව වරකට මාස තුනක් නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති කාලසීමාව ඇතුළත අපරාධ නඩු පවරනු නොලැබුවේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් සඳහන් කරනු ලැබිය යුතු කොන්දේසි මත මහෙස්ත්‍රාත්වරයා විසින් සැකකරු ඇප මත මුදා හරිනු ලැබිය යුතු ය.

රඳවා තැබීමේ නියම

31. (1) (අ) පොලිස්පතිවරයා හෝ පොලිස්පතිවරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙන ලද නියෝජ්‍ය පොලිස්පති ධුරයට නොඅඩු ධුරයක් දරන යම් නිලධරයකු විසින් ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත තත් කාර්යය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මගින් (2) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් කාර්යයක් සඳහා සැකකරුවෙකු රඳවා තැබීම පිණිස රඳවා තැබීමේ නියමයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, සැකකරු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් එකී හේතු වාර්තාගත කිරීමෙන් පසු, අනුමත රඳවා තැබීමේ ස්ථානයක, අනුමත රඳවා තබාගැනීමේ කොන්දේසි යටතේ සැකකරු රඳවා තැබීමට බලය ලබා දෙමින් හතරවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව රඳවා තැබීමේ නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ඇ) මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක් පළමුව මාස දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක, එය නිකුත් කිරීම සඳහා වූ හේතු ඇතුළත් විය යුතු අතර, හුදෙක්ම පහත දැක්වෙන කාර්ය සඳහා අවශ්‍ය වන විට දී පමණක් නිකුත් කරනු ලැබිය යුතු ය:-

(අ) සැකකරුට අදාළ විමර්ශන පැවැත්වීමට පහසුකම් සැලසීම සඳහා ;

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට අදාළ විමර්ශනය සඳහා තොරතුරු සහ ලබා ගත හැකි සාක්ෂි ලබා ගැනීම සඳහා;

(ඇ) රඳවා තබා සිටින සැකකරුගෙන් ප්‍රශ්න කිරීම සඳහා ; සහ

(ඇ) රඳවා තැබීමේ නියමයෙහි වාර්තාගත කළ යුතු හේතූන් මත මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වන සාක්ෂි සුරක්ෂිත කිරීම.

(3) 28 වන වගන්තිය යටතේ අදාළ සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාව වන විට, මේ වගන්තිය යටතේ වන රඳවා තැබීමේ නියමයක් නිකුත් කර ඇති විට දී, රඳවා තැබීමේ නියමයේ සහතික කළ පිටපතක් පරීක්ෂා කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වන සෑම රඳවා තැබීමේ නියමයක ම පිටපතක් රඳවා තබා ඇති සැකකරුට එම නියමය කරනු ලැබූ දිනයේ සිට පැය හතළිස් අටක කාලසීමාවක් ඇතුළත භාර දිය යුතු අතර, සැකකරු විසින්, එය භාරගත් බවට වන පිළිගැනීමක් ලබාගෙන එය අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කරනු ලැබිය යුතු ය.

(5) රඳවා තැබීමේ නියමයෙහි පිටපතක් සැකකරුගේ ළඟම ඥාතියාට හෝ පවුලේ වැඩිහිටි සාමාජිකයකුට එම නියමය කරනු ලැබූ දිනයේ සිට පැය හතළිස් අටක කාලසීමාවක් ඇතුළත භාර දිය යුතු අතර, එකී පිටපත භාරදෙනු ලබන ආකාරය සම්බන්ධයෙන් 26 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(6) ජනාධිපතිවරයා විසින්, පොලිස්පතිවරයාගේ නිර්දේශය මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ වගන්තියේ කාර්යය සඳහා "අනුමත රඳවා තැබීමේ ස්ථාන" ලෙස යම් ස්ථාන සංඛ්‍යාවක් නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(7) පොලිස්පතිවරයා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විමසා, ජනාධිපතිවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ වගන්තියේ කාර්යය සඳහා "අනුමත රඳවා තැබීමේ කොන්දේසි" ලෙස යම් රඳවා තැබීමේ කොන්දේසි නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

රඳවා තැබීමේ ස්ථානයකට මහේස්ත්‍රාත්-වරයා පැමිණිය යුතු බව.

**32.** (1) රඳවා තැබීමේ නියමයේ අධිකාරය යටතේ රඳවා තබා ගනු ලැබූ සැකකරුවකු ඉදිරිපත් කරනු ලබන්නේ යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා විසින් එකී

රඳවා තැබීමේ ස්ථානය භාර බලධරයාට පූර්ව දැනුම් දීමක් ලබා දීමෙන් තොරව -

(අ) එකී සැකකරු රඳවා තැබීමේ ස්ථානය සතියකට වරක් නිරීක්ෂණය කරනු ලැබීම; සහ

(ආ) සැකකරු සම්මුඛ සාකච්ඡාවකට භාජනය කර ඔහුගේ යහපැවැත්ම පිළිබඳ සොයා බැලීම,

කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයාට ඉක්මණින් සහ බාධාවකින් තොරව යම් රඳවා තැබීමේ ස්ථානයකට ප්‍රවේශ වීමට ඉඩ ලබා දීම එම ස්ථානය භාර බලධරයාගේ කාර්යය විය යුතු ය.

(3) සැකකරු වධහිංසාවලට භාජනය වී ඇති බව මහෙස්ත්‍රාත්වරයා විසින් නිරීක්ෂණය කරනු ලබන්නේ නම් හෝ තමා වධහිංසාවලට භාජනය වූ බවට සැකකරු චෝදනා කරනු ලබන්නේ නම්, සැකකරු අධිකරණ වෛද්‍ය නිලධරයකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ද ඒ පිළිබඳව වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් වහාම ආඥා කරනු ලැබිය යුතු ය.

(4) සැකකරුට සහ අදාළ පොලිස් නිලධරයාට හෝ නිලධරයන්ට කරුණු දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීමෙන් පසු, සැකකරු වධහිංසාවලට භාජනය වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, ඔහු විසින් 29 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්ති ප්‍රකාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

රඳවා තැබීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දීම

33. (1) සැකකරුවකු රඳවා තබනු ලබන්නේ යම් රඳවා තැබීමේ ස්ථානයක ද, එම රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයා විසින්, ප්‍රායෝගික හැකි තාක් ඉක්මණින්, එහෙත් කවර අවස්ථාවක දී වුව ද, පැය හැත්තෑ දෙකක් පසු නොවන කාලයක් තුළ දී, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව රඳවා තැබීමේ ස්ථානයට පැමිණීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති තැනැත්තන්ට රඳවා තැබීමේ ස්ථානයට පැමිණීම සඳහා එම රඳවා තැබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව සම්පත් කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය

(2) රඳවා තැබීමේ නියමයේ පිටපතක් ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මණින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත භාරදෙනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අනුමත රඳවා තැබීමේ ස්ථානයට පැමිණීම

**34.** පූර්ව දැනුම් දීමක් ලබා දීමෙන් තොරව -

(අ) යම් අනුමත රඳවා තැබීමේ ස්ථානයකට ඇතුළු වීමට සහ පරීක්ෂා කිරීමට;

(ආ) එකී රඳවා තබා ගැනීමේ ස්ථානයේ පවත්වාගෙන යනු ලැබිය යුතු රඳවා තැබීමේ නාමලේඛන, රඳවා තැබීමේ නියමයන් සහ වෙනත් පොත්පත් හා ලේඛන ඉල්ලා සිටීමට සහ පරීක්ෂා කිරීමට; සහ

(ඇ) එකී ස්ථානයේ රඳවා තබා ඇති තැනැත්තන් සම්මුඛ සාකච්ඡාවට භාජනය කිරීමට,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යම් බලයලත් නිලධරයකුට හිමිකම තිබිය යුතු ය.

යම් රඳවා තැබීමේ ස්ථානයකට පැමිණීමට මහෙස්ත්‍රාත්-වරුන්ට හිමිකම තිබිය යුතු බව

**35.** පූර්ව දැනුම් දීමකින් තොරව යම් අනුමත රඳවා තැබීමේ ස්ථානයකට ඇතුළු වීමට, එකී රඳවා තැබීමේ ස්ථානය පරීක්ෂා කිරීමට, එකී රඳවා තැබීමේ ස්ථානයේ පවත්වාගෙන යනු ලැබිය යුතු නාමලේඛන, රඳවා තැබීමේ නියමයන් සහ වෙනත් පොත්පත් සහ ලේඛන පරීක්ෂා කිරීමට යම් මහෙස්ත්‍රාත්වරයකුට හිමිකම තිබිය යුතු ය.

මාස දෙකක් ඉක්මවා රඳවා තැබීම මහෙ-ස්ත්‍රාත්වරයාගේ අනුමතය ඇතිව පමණක් සිදු කළ යුතු බව

**36.** (1) 31 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රඳවා තැබීමේ නියමයක් ප්‍රකාරව මාස දෙකක කාලසීමාවක් ඉක්මවා යම් සැකකරුවකු රඳවා තබා ගැනීමට අවශ්‍ය වන විට දී, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් -

(අ) සැකකරුට විරුද්ධව ඇති චෝදනාව;

(ආ) විමර්ශනයේ දී අනාවරණය වූ කරුණු; සහ

(ඇ) වැඩිදුර රඳවා තැබීමට අවශ්‍ය හේතු,

සඳහන් කරමින් මහෙස්ත්‍රාත් අධිකරණයේ රහස්‍ය වාර්තාවක් ගොනු කර ඒ සැකකරු අඛණ්ඩව රඳවා තැබීම සඳහා මහෙස්ත්‍රාත්වරයාගේ අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, එකී වාර්තාවේ අඩංගු තොරතුරු අනාවරණය වීම විමර්ශන කටයුතුවලට බලනොපාන බවට සහතික කරනු ලැබිය යුතු ය.

(3) රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමක් අපේක්ෂා කරන්නා වූ පොලිස් නිලධරයාගේ කරුණු දැක්වීම් සහ සැකකරු හෝ ඔහුගේ නීතිඥවරයා විසින් එම දීර්ඝ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලැබූ විරෝධතා මහෙස්ත්‍රාත්වරයා විසින් සටහන් කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත්වරයා විසින්, හේතු දක්වමින්, රඳවා තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීමට හෝ එවන් දීර්ඝ කිරීමක් ප්‍රතික්ෂේප කිරීමට ආඥා කරනු ලැබිය හැකි ය.

(5) (අ) රඳවා තැබීමේ නියමයක් දීර්ඝ කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, සැකකරු දිගටම රිමාන්ඩ් භාරයේ තැබීමට යම් සාධාරණ හේතුවක් පවතින්නේ ද යන්න ඔහු විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(ආ) සැකකරු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කර තිබිය හැකි බවට විශ්වාස කිරීමට යම් සාධාරණ පදනමක් පවතින බව, පරීක්ෂණයෙන් පසුව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන්නේ නම්, සැකකරු රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබිය යුතු ය.

(ඇ) සැකකරු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට විශ්වාස කිරීමට කිසිදු හේතුවක් නොමැති අවස්ථාවක දී, ඔහු නිදහස් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන නඩු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත්ව රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

රඳවා තැබීමේ නියම යටතේ රඳවා තැබීමේ උපරිම කාලසීමාව

**37.** සැකකරුවකු 31 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ රඳවා තැබීමේ නියමයක් යටතේ මාස දොළහක් ඉක්මවන්නා වූ කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව

38. (1) යම් රඳවා තැබීමේ නියමයකට අදාළ කාලය අතරතුර, සෑම දින දහහතරකට වරක් ම සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) සැකකරු මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින්, 28 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) රඳවා තැබීමේ නියමයක් යටතේ වන රඳවා තැබීමේ කාලසීමාව සම්පූර්ණ වූ පසු සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) සැකකරු විසින් සිදු කර ඇතැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් වන විමර්ශනය සම්බන්ධයෙන් පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් පරීක්ෂා කිරීමෙන් පසු, සැකකරු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති බවට නිගමනය කිරීමට බැලූ බැල්මට පෙනෙන පදනමක් ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින්, සැකකරු රිමාන්ඩ් භාරයේ රඳවා තැබීමට විධාන කරනු ලැබිය යුතු ය.

පොලිස් නිලධරයාට රිමාන්ඩ් භාරයේ සිටින සැකකරු වෙත ප්‍රවේශ විය හැකි බව

**39.** (1) මේ පනත යටතේ යම් විමර්ශනයක් සිදු කරන පොලිස් නිලධරයකුට, මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලබන ආඥාවක අධිකාරය යටතේ -

(අ) මේ පනත ප්‍රකාරව රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ යම් සැකකරුවකු වෙත ප්‍රවේශ වීමට සහ සැකකරු සමඟ සම්මුඛව සාකච්ඡා කිරීමට;

(ආ) තත් කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කර ලබාගත් අවසරය ඇතිව, ඔහුගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට ; හෝ

(ඇ) වැඩිදුර විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවක අධිකාරය යටතේ සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවතට ගැනීමට,

හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද, (අ), (ආ) සහ (ඇ) ඡේදවල දක්වා ඇති සෑම අවස්ථාවක ම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු සහභාගී විය යුතු ය.

(2) සැකකරුවකු, මේ පනතේ නිශ්චිතව දක්වා ඇති වරදක් හැර වෙනත් යම් වරදක් සඳහා වරදකරු කර ඇති සහ යම් කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනය විඳිමින් සිටින අවස්ථාවක, මේ පනත යටතේ විමර්ශනයක් පවත්වනු ලබන පොලිස් නිලධරයකුට, මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලබන ආඥාවක අධිකාරය යටතේ -

(අ) මේ පනත ප්‍රකාරව බන්ධනාගාරයේ සිටින යම් සැකකරුවකු වෙත ප්‍රවේශ වීමට සහ සැකකරු සමග සම්මුඛව සාකච්ඡා කිරීමට;

(ආ) තත් කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයාගෙන් ඉල්ලීමක් කර ලබාගත් අවසරය ඇතිව, ඔහුගේ ප්‍රකාශ සටහන් කර ගැනීමට; සහ

(ඇ) වැඩිදුර විමර්ශන පැවැත්වීමේ කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවක අධිකාරය යටතේ සැකකරු බන්ධනාගාරයෙන් ඉවතට ගැනීමට,

හිමිකම තිබිය යුතු යః

එසේ වුව ද, ඉහත සඳහන් (අ), (ආ) සහ (ඇ) ඡේදවල දක්වා ඇති සෑම අවස්ථාවකම, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධරයකු සහභාගී විය යුතු ය.

රිමාන්ඩ් භාරයේ තැබීම අතරතුර රඳවා තැබීම

**40.** (1) මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ යම් තැනැත්තකු -

(අ) මේ පනත යටතේ යම් වරදක් සිදු කරන බවට ;

(ආ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීමට සූදානම් වන බවට හෝ තැත් කරන බවට ;

(ඇ) රිමාන්ඩ් භාරයෙන් පලා යාමට තැත් කරන බවට ; හෝ

(ඈ) සිරභාරයට ගැනීමට පෙරාතුව, මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇති බවට සහ එකී පොලිස් ස්ථානය භාර නිලධරයා එම කරුණ දැන නොසිටි බවට,

යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකු වෙත ඔහු විසින් සත්‍ය බවට විශ්වාස කරන තොරතුරු ලැබුණු අවස්ථාවක දී, ඔහු විසින්, එම තොරතුරු අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින් එම තොරතුරු පිළිබඳ වහාම පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, පරීක්ෂණය අවසානයේ දී, පොලිස් ස්ථානය භාර නිලධරයා සද්භාවයෙන් ක්‍රියා කර ඇති බවට හා පොලීසිය විසින් සැකකරුට විරුද්ධව සිදු කරනු ලැබූ චෝදනාව ප්‍රබල සාක්ෂි මත සිදු කර ඇති බව පෙනී යන බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වන්නේ නම් සහ සැකකරු රැඳවුම් භාරයේ තැබීම යෝග්‍ය බවට මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන්නේ නම්, රඳවා තැබීමේ නියමයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඔහු විසින් පොලිස් ස්ථානය භාර නිලධරයාට -

(අ) සැකකරු ස්වකීය භාරයට ගැනීමට;

(ආ) සැකකරු ස්වකීය භාරයට ගෙන ඔහු රිමාන්ඩ් භාරයේ තැබීමට;

(ඇ) සැකකරු රිමාන්ඩ් භාරයෙන් ඉවත් කිරීමට;

(ඈ) එකී රඳවා තැබීමේ නියමය ප්‍රකාරව එම සැකකරු රඳවා තබා ගැනීමට; සහ

(ඉ) සැකකරු හුදෙකලා කොට තබන ලෙසට හෝ ආරක්ෂාව යටතේ තබන ලෙස නියෝග කිරීමට,

අවසර දෙනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන රඳවා තැබීමේ නියමය -

(අ) සැකකරු රිමාන්ඩ් භාරයේ තබා ඇති ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) වරකට සති දෙකක කාලසීමාවක් බැගින් සති දොළහක සමුච්චිත කාලසීමාවක් සඳහා විය යුතු ය; හෝ

(ඇ) සෑම දින දහහතරකට වරක්ම මහෙස්ත්‍රාත්වරයා විසින් සමාලෝචනයට ලක් කරනු ලැබිය යුතු ය.

(4) සැකකරු රිමාන්ඩ් භාරයේ සිට රැඳවුම් භාරයට මාරු කිරීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයෙන් සහ රඳවා තැබීමෙන් මුදා හැරීම

**41.** (1) මේ පනත යටතේ සිර භාරයට ගත් යම් සැකකරුවකු රිමාන්ඩ් භාරයෙන් හෝ රඳවා තැබීමෙන් මුදා හැරීම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව සහ මහෙස්ත්‍රාත්වරයා විසින් පනවනු ලැබිය හැකි යම් කොන්දේසියකට යටත්ව පමණක් කරනු ලැබිය යුතු ය.

(2) ලිඛිතව බලය පවරනු ලැබූ නිලධරයකු මුදා හැරීම සිදුවන අවස්ථාවට සහභාගී වීම සඳහා එවීමට අවශ්‍ය විය හැකි ප්‍රමාණවත් කාලසීමාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලබා දෙමින් අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් සැකකරු මුදා හැරීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

රිමාන්ඩ් භාරයේ තබා ඇති හෝ රඳවා තබා ඇති තැනැත්තෙකු වෙත නීතිඥවරයකු විසින් ප්‍රවේශ වීම

**42.** (1) මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබා ඇති හෝ රඳවා තබා ඇති සැකකරුවකු නියෝජනය කරන යම් නීතිඥවරයකුට මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කොට ඇති කොන්දේසි හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සලසා ඇති ආකාරයට එවැනි තැනැත්තකු වෙත ප්‍රවේශ වීමට සහ එම තැනැත්තා නියෝජනය කිරීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබා ඇති හෝ රඳවා තබා ඇති තැනැත්තකුට, ලිඛිත නීතිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි එම තැනැත්තාගේ ඥාතීන් සමග සන්නිවේදනය කිරීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතැම් වගන්ති අදාළ කර නොගත යුතු බව

**43.** මේ පනත යටතේ වන සැකකරුවකු සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 115 වන සහ 116 වන වගන්තිවල විධිවිධාන අදාළ කරගනු නොලැබිය යුතු ය.

**අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදාළ කර ගැනීම**

**44.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වන යම් නඩු කටයුත්තකට අදාළ කරගනු ලැබිය යුතු ය.

**මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියෙහි නඩු කටයුතු**

**45.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 9 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මහෙස්ත්‍රාත්වරයකු වෙත කලින් ඉදිරිපත් කරනු ලැබූ, මේ පනත යටතේ වන සැකකරුවකු සම්බන්ධයෙන් වන විමර්ශන හා නඩු කටයුතු එසේ එම මහෙස්ත්‍රාත්වරයා වෙත සැකකරු ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී, එකී මහෙස්ත්‍රාත්වරයා විනිශ්චයාසනය දැරූ මහෙස්ත්‍රාත් අධිකරණයේ දී පවත්වනු ලැබිය යුතු ය.

**සැකකරුට මානුෂිකව සැලකිය යුතු බව**

**46.** (1) මේ පනතේ විධිවිධාන යටතේ, අවස්ථාවෝචිත පරිදි, රඳවා තබනු ලැබූ හෝ රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ සැකකරු රඳවා තැබීමේ ස්ථානය හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානය ඔහුට මානුෂීය ලෙස සැලකීම සඳහා අවශ්‍ය වන අවශ්‍යතාවලින් සමන්විත විය යුතු අතර, එකී රඳවා තබන ස්ථානය හෝ බන්ධනාගාරය භාර නිලධරයාගේ පූර්ව අවසරය ඇතිව රැඳවුම් භාරයේ හෝ රිමාන්ඩ් භාරයේ සිටින සැකකරුගේ පවුලේ සාමාජිකයන්ට හා ඔහුගේ නීතිඥවරයාට එම රඳවා තබන ස්ථානයට හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානයට ප්‍රවේශ වීමට හැකි විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ රඳවා තැබීමේ ස්ථානය හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානය පරීක්ෂා කිරීමක දී, රඳවා තැබීමේ ස්ථානය හෝ රිමාන්ඩ් භාරයේ තබන ස්ථානය, (1) වන උප වගන්තියේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල නොවන බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට හෝ මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන්නේ නම්, එම කරුණු -

(අ) රඳවා තැබීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවල දී පොලිස්පතිවරයාට; හෝ

(ආ) රිමාන්ඩ් භාරයේ තැබීමක් සම්බන්ධයෙන් වන අවස්ථාවල දී බන්ධනාගාර අධිකාරීවරයාට,

දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) සැකකරුට මානුෂීය ලෙස සැලකීම සඳහා අවශ්‍ය වන පියවර හැකි උපරිම ප්‍රමාණයෙන් ගනු ලැබීම, අවස්ථාවෝචිත පරිදි, පොලිස්පතිවරයාගේ හෝ බන්ධනාගාර අධිකාරීවරයාගේ කාර්යය වන්නේ ය.

(4) යම් සැකකරුවකු -

(අ) මාසයක් ඉක්මවන කාලසීමාවක් රැඳවුම් භාරයේ තබනු ලබන;

(ආ) නඩු විභාගය ආරම්භ කරන තෙක් රිමාන්ඩ් භාරයේ තබනු ලබන; හෝ

(ඇ) නඩු විභාගය අවසන් වන තෙක් රිමාන්ඩ් භාරයේ තබනු ලබන,

අවස්ථාවක දී එකී සැකකරු රඳවා තබා ඇති රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයා විසින්, එම සැකකරුගේ ළඟම ඥාතියාට හා ශ්‍රී මානව හිමිකම් කොමිෂන් සභාවට පහත දැක්වෙන තොරතුරු ඇතුළත් නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය:-

(i) රඳවා තැබීමේ හෝ රිමාන්ඩ් භාරයේ තැබීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා ආඥාවක් කරන ලද්දේ කවර හේතු මත ද යන්න;

(ii) සැකකරු රඳවා තබා ඇති අවස්ථාවල දී, පවත්වාගෙන යන විමර්ශනවලට අගතියක් සිදු නොවන පරිදි, විමර්ශන උද්‍යෝගයෙන් හා කඩිනම්ව පවත්වාගෙන යාමට අවශ්‍ය වන තොරතුරු; සහ

(iii) සැකකරු රිමාන්ඩ් භාරයේ තබා ඇති අවස්ථාවල දී, අවස්ථාවෝචිත පරිදි, අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම වහාම සිදු කිරීමට නොහැකි වීමට හෝ නඩු විභාගය වහාම ආරම්භ කිරීමට නොහැකි වීමට හෝ නඩු විභාගය කඩිනම්ව අවසන් කිරීමට නොහැකි වීමට හේතු.

## IV වන කොටස

### මේ පනත යටතේ ඇතැම් නිලධරයන්ගේ බලතල සහ කාර්ය

*මේ පනත යටතේ පොලිස් නිලධරයන්ගේ බලතල*

**47.** මේ පනත යටතේ වන වැරදි හා එවැනි වරදක් සිදු කිරීමේ ක්‍රියාවලිය තුළ දී කරනු ලැබිය හැකි වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වැරදි පිළිබඳව විමර්ශන පැවැත්වීමේ හෝ එවැනි යම් වරදක් සිදු කිරීම වැළැක්වීමේ කාර්යය සඳහා මේ පනත යටතේ වන වැරදි පිළිබඳ විමර්ශනය කිරීම සහ ඒවා වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි ප්‍රමාණයට පොලිස් ආඥාපනත හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත හෝ අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පොලිස් නිලධරයන්ට පවරනු ලැබූ යම් බලතලවලට අතිරේකව, මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති බලතල ද පොලිස් නිලධරයන් සතු විය යුතු ය.

*මේ පනත යටතේ වන වැරදි සිදු කිරීම වැළැක්වීම ඇතැම් නිලධරයන්ගේ කාර්යය වන බව*

**48.** (1) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා මේ පනතේ විධිවිධානවලට යටත්ව අවශ්‍ය පියවර ගැනීම, සෑම පොලිස් නිලධරයකුගේ ම, සෑම සන්නද්ධ හමුදා සාමාජිකයකුගේ ම හා වෙරළ ආරක්ෂක නිලධරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා එවැනි යම් නිලධරයකු විසින් -

(අ) සද්භාවයෙන්;

(ආ) සිදු කරන ලදැයි කියනු ලබන වරද සිදු කිරීම මගින් පැමිණවිය හැකි හානියට සමානුපාතිකව;

(ඇ) පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අන් සියලු ක්‍රම නිරර්ථක වන බව සනාථ වූයේ නම් පමණක්; සහ

(ඈ) මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම වළක්වනු ලැබීමට හෝ මේ පනත යටතේ වැරදි සිදු කරනු ලැබූ තැනැත්තන් ග්‍රහණය කර ගැනීම සඳහා යම් පියවර අවශ්‍ය විය හැකි ප්‍රමාණයට පමණක්,

එම පියවර ගනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් නිලධරයකු විසින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව පෞද්ගලික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමේ දී හැර අතික්‍රමික බලයක් භාවිත නොකළ යුතු ය.

ශ්‍රී ලංකා පොලිසියේ විශේෂිත ත්‍රස්ත විරෝධී නියෝජ්‍ය ආයතනය

**49.** (1) පොලිස්පතිවරයා විසින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ හා එයට එරෙහි වීමේ හා මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම පිළිබඳව විමර්ශනය කිරීමේ වගකීම පවරනු ලැබූ, (මෙහි මින් මතු, "විශේෂිත නියෝජ්‍යායතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පොලිසියේ විශේෂිත ත්‍රස්ත විරෝධී නියෝජ්‍යායතනය නම් කර පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් වන යම් විමර්ශනයක් හෝ අර්ධ වශයෙන් පවත්වනු ලැබූ යම් විමර්ශනයක්, ශ්‍රී ලංකා පොලිසියේ වෙනත් යම් අංශයකට හෝ ඒකකයකට හෝ යම් පොලිස් ස්ථානයකට පැවරීමට පොලිස්පතිවරයා හිමිකම් ලැබිය යුතු ය.

(3) පහත දැක්වෙන දෑ කිරීම විශේෂිත නියෝජ්‍යායතනයේ කාර්යය විය යුතු ය:-

(අ) මධ්‍යගත දත්ත ගබඩාව පවත්වාගෙන යාම;

(ආ) මේ පනත යටතේ වැරදි සිදු කිරීමට අදාළ සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම;

(ඇ) මේ පනත යටතේ වැරදි සිදු කරන තැනැත්තන් සම්බන්ධයෙන් විමර්ශන සහ නඩු කටයුතු පැවැත්වීම;

(ඈ) ත්‍රස්තවාදය මගින් එල්ල වී ඇති තර්ජනයේ තත්ත්වය ඇගැයුමට ලක්කර, මහජනතාවට අනතුරු හැඟවීම් නිකුත් කිරීම; සහ

(ඉ) ත්‍රස්තවාදය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ විමර්ශන ක්‍රමවේද හා ක්‍රමෝපායයන් ද, හොඳම පරිචයන් සහ ප්‍රමිති ද වැඩි දියුණු කිරීම.

**විමර්ශකයන්ගේ විශේෂ කණ්ඩායම් පත් කිරීම**

**50.** (1) මේ පනත යටතේ වන යම් වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ මේ පනත යටතේ වන යම් වරදක් සිදු කිරීම හෝ සිදු කිරීමට සූදානම් වීම පිළිබඳ යම් තොරතුරක් ලැබුණු විට, පොලිස්පතිවරයා විසින්, ඒ වරද පිළිබඳ විමර්ශනය කිරීම සඳහා හෝ එය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "විමර්ශන කණ්ඩායම" යනුවෙන් සඳහන් කරනු ලබන) විමර්ශකයන්ගේ විශේෂ කණ්ඩායමක් පත් කරනු ලැබිය හැකි ය:-

(අ) විමර්ශන කණ්ඩායමේ ප්‍රධානයා විය යුතු, නමින් සහ නිලයෙන් නම් කරනු ලැබූ පොලිස් නිලධරයෙක්;

(ආ) අපරාධ විමර්ශකයන් විය යුතු, නමින් සහ නිලයෙන් නම් කරනු ලැබූ වෙනත් යම් පොලිස් නිලධරයන් සංඛ්‍යාවක්;

(ඇ) යම් නීති විශාරදයන් සංඛ්‍යාවක්;

(ඈ) යම් අපරාධ පරීක්ෂක නිලධරයන් සංඛ්‍යාවක්;

(ඉ) යම් වෝහාරික වෛද්‍ය විශේෂඥයින් සංඛ්‍යාවක්;

(ඊ) යම් වෝහාරික මනෝ විද්‍යාඥයින් සංඛ්‍යාවක්;

(උ) යම් මස්තු විද්‍යාව, ජාන විද්‍යාව, බැලිස්ටික්, පුපුරණ ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය විද්‍යාඥයින් ඇතුළුව වෝහාරික විද්‍යාඥයින් යම් සංඛ්‍යාවක්;

(ඌ) යම් ඇඟිලි සලකුණු විශේෂඥයන් සංඛ්‍යාවක්;

(එ) යම් අත් අකුරු සහ සැක කටයුතු ලේඛන පිළිබඳ විශේෂඥයින් සංඛ්‍යාවක්;

(ඒ) යම් පරිගණක හා ස්වයංක්‍රීය ජාල විශේෂඥයින් සංඛ්‍යාවක්;

(ඔ) යම් ව්‍යවහාරික විගණකයින් සංඛ්‍යාවක්;

(ඕ) යම් ඇනලොග්, ඩිජිටල් තාක්ෂණය සහ ජංගම හා චන්ද්‍රිකා සන්නිවේදන තාක්ෂණයන්හි විශේෂඥයින් සංඛ්‍යාවක්;

(ක) යම් ඡායාරූප ශිල්පීන් හා වීඩියෝ ශිල්පීන් සංඛ්‍යාවක්; සහ

(ග) පොලිස්පතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් විශේෂඥයින් යම් සංඛ්‍යාවක්.

(2) (අ) පොලිස්පතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විමර්ශන කණ්ඩායම සඳහා පොලිස් ස්ථානයක් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) එකී පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, මේ පනත යටතේ හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ එවැනි යම් ස්ථාන භාර නිලධරයකුට පවරනු ලැබූ සාමාන්‍ය කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට අමතරව, විමර්ශන කණ්ඩායමට සහාය ලබා දිය යුතු ය.

(3) පොලිස් නිලධරයන් නොවන විමර්ශන කණ්ඩායමේ සාමාජිකයන් එකී විමර්ශන කණ්ඩායම වෙත පවරනු ලැබූ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සහාය කණ්ඩායම් සංස්ථාපනය කිරීම

**51.** (1) මේ පනත යටතේ වන වරදක් කර තිබෙන අවස්ථාවක යම් අපරාධ ස්ථානයක දී පහත දැක්වෙන කාර්යවල නියැලීම සඳහා, විමර්ශන කණ්ඩායමේ සාමාජිකයකු වන නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින්, අදාළ අධිකාරීන්ගේ එකඟත්වය ඇතිව, යම් සන්නද්ධ හමුදා සාමාජිකයන්ගෙන්, වෛද්‍ය වරුන්ගෙන් සහ වෙනත් සෞඛ්‍ය සේවකයන්ගෙන්, හදිසි සහන සේවා සපයන්නන්ගෙන්, රජයේ සේවකයන්ගෙන් හා වෙනත් අවශ්‍ය තැනැත්තන්ගෙන් සමන්විත සහාය කණ්ඩායම් ස්ථාපනය කරනු ලැබිය හැකි ය:-

(අ) යම් වරදක වින්දිතයන් සහ වෙනත් තැනැත්තන් අපරාධ ස්ථානයෙන් මුදවා ගැනීම හා ඉවත් කිරීම;

(ආ) හදිසි වෛද්‍ය ප්‍රතිකාර සැපයීම සඳහා;

(ඇ) මළ සිරුරු සොයා ගැනීම සඳහා;

(ඈ) ගිනි නිවීම සඳහා;

(ඉ) පුපුරණ ද්‍රව්‍ය හා වෙනත් මාරක සහ අන්තරායකාරී ද්‍රව්‍ය අක්‍රිය කිරීම සඳහා;

(ඊ) මාරාන්තික සහ අන්තරායක ද්‍රව්‍ය අක්‍රිය කිරීම පිණිස පාලනය කරන ලද පිපිරීම් සිදු කිරීම;

(උ) සුන්බුන් ඉවත් කිරීම සඳහා;

(ඌ) පිවිසුම් මාර්ග නිර්මාණය කිරීම සඳහා; සහ

(එ) වෙනත් හදිසි, මානුෂීය සහ ආරක්ෂක අවශ්‍යතා සහ සේවා සැපයීම සඳහා.

(2) (1) වන උපවගන්තිය යටතේ වන සහාය අපේක්ෂා කරනුයේ යම් තැනැත්තකුගෙන් ද, ඒ සහාය අවශ්‍ය කරනු ලැබිය හැකි ආකාරයට ලබා දීම, ඒ සෑම තැනැත්තකුගේ ම කාර්යය වන්නේ ය.

විමර්ශනවලට පහසුකම් සැලසීම සඳහා වන බලතල

**52.** (1) මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ප්‍රකාරව විමර්ශනයක් පවත්වාගෙන යාමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් ලිඛිතව බලය ලබා දී ඇති උප පොලිස් පරීක්ෂකවරයකුට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකුට මේ පනත යටතේ වරදක් කරන ලද බවට සැක කරන ලද යම් තැනැත්තකු හෝ විමර්ශනයක් පැවැත්වීම සඳහා යම් තැනැත්තකුගේ පෙනී සිටීම හෝ සහාය අවශ්‍ය වන්නේ ද, එවැනි තැනැත්තකුට -

(අ) සම්මුඛ සාකච්ඡාවක් සඳහා පෙනී සිටීම;

(ආ) ඔහු වෙත යොමු කරන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම;

(ඇ) තොරතුරු සැපයීම;

(ඈ) ප්‍රකාශ ලබා දීම;

(ඉ) දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරුමක් මත ප්‍රකාශ ලබා දීම:

එසේ වුව ද, දිවුරුම් ප්‍රකාශයක් මත හෝ දිවුරුමක් මත ලබා දෙන ප්‍රකාශ මහෙස්ත්‍රාත්වරයකුගේ ආඥාවක් මත පමණක් ලබා ගත යුතු ය;

(ඊ) එම තැනැත්තා සන්තකයේ හෝ පාලනයේ පැවතිය හැකි යම් ලේඛනයක් හෝ දෙයක් භාර දීම;

(උ) විමර්ශනයක් පැවැත්වීමේදී සහාය වීම;

(ඌ) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කිරීම පිළිබඳ සැකයට භාජනය වී සිටින විට, ඒ තැනැත්තාගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ පෞද්ගලිකත්වය පිළිබඳ නිසි සැලකිල්ලක් දක්වමින් ඔහු කායික පරීක්ෂණයක් සඳහා යොමු කිරීම; සහ

(එ) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කිරීම පිළිබඳ සැකයට භාජනය වී සිටින විට, ඒ තැනැත්තාගේ ඡායාරූප ලබා ගැනීමට, වීඩියෝ පටිගත කිරීම් ලබා ගැනීමට සහ ඇඟිලි සලකුණු හෝ අත්ලේ හෝ පතුලේ සලකුණු ලබාගැනීමට ඔහු යොමු කිරීමට,

නියම කිරීම සඳහා බලය තිබිය යුතු ය.

(2) තමා වරදක් කළ බවට හැඟවෙන හෝ අපරාධාරෝපණය කරන ප්‍රකාශයක් කිරීමට හෝ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කිසිම තැනැත්තකු යටත් නොවන්නේ ය.

(3) සම්මුඛ සාකච්ඡාවකට භාජනය විය යුතු සහ ඔහුගේ ප්‍රකාශය සටහන් කර ගත යුතු යම් තැනැත්තකුට -

(අ) එකී සම්මුඛ සාකච්ඡාවට පෙරාතුව, නීති උපදෙස් ලබා ගැනීමට ඔහු කැමති නීතිඥවරයකු වෙත ප්‍රවේශ වීමට ඔහුට ඇති අයිතිවාසිකම පිළිබඳ දැනුම් දෙනු ලැබිය යුතු ය; සහ

(ආ) අවශ්‍ය අවස්ථාවක දී, භාෂක පරිවර්තකයකුගේ සේවය සහිතව ඒ තැනැත්තා විසින් අවබෝධ කරගත හැකි භාෂාවකින් සම්මුඛ සාකච්ඡාව පැවැත්විය යුතු අතර, ප්‍රකාශය වාර්තා කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, භාෂක පරිවර්තකයකුගේ සේවය ලබාගෙන ඇති අවස්ථාවක දී, සම්මුඛ සාකච්ඡාව එහි පරිවර්තනය සමඟ වාර්තා කළ යුතු අතර, පිටපත් කරනු ලැබ අනාගතයේ දී සත්‍යායනය කිරීම සඳහා සංරක්ෂණය කර තැබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කරන පොලිස් නිලධරයකු විසින්, යම් තැනැත්තකු සම්මුඛ සාකච්ඡාවට භාජනය කරනු ලැබීමට පෙරාතුව ඒ තැනැත්තාට මේ පනත යටතේ වන ඔහුගේ අයිතිවාසිකම් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) හැකි සෑම විටක දී ම, සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයට වාර්තා කරනු ලැබිය යුතු ය.

යාත්‍රාවක් හෝ වාහනයක් නැවැත්වීම සඳහා බලය භාවිත කිරීම

**53.** යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක් හෝ ගුවන් යානයක් භාර තැනැත්තකු මේ පනතේ කාර්ය සඳහා ඒ වාහනය, යාත්‍රාව, දුම්රිය හෝ ගුවන් යානය නවත්වන ලෙස පොලිස් නිලධරයකු විසින් හෝ ඔහුගේ ඉල්ලීම මත ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකු විසින් කරන ලද යම් අණ කිරීමකට අවනත නොවන අවස්ථාවක දී, එම පොලිස් නිලධරයා හෝ තැනැත්තා විසින් එකී වාහනය නැවැත්වීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි බලය භාවිත කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එවැනි යම් බලයක් භාවිත කළ හැකි වන්නේ, එකී වාහනය, යාත්‍රාව, දුම්රිය හෝ ගුවන් යානය නතර කිරීමේ අන් සියලු ක්‍රම නිරර්ථක වී ඇති බව සනාථ වී තිබෙන අවස්ථාවක දී පමණක් වන්නේ ය:

එසේම තවදුරටත්, එවැනි යම් නිලධරයකු විසින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව පුද්ගලික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමේ දී හැර අත්‍යුක්‍රමික බලය භාවිත කරනු නොලැබිය යුතු ය.

*යම් වාහනයක්, යාත්‍රාවක් යනාදිය ස්වකීය පාලනය යටතට ගැනීම*

**54.** (1) මේ පනත යටතේ වන විමර්ශනයක් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා හෝ වරදක් සිදු කිරීම වැළැක්වීම සඳහා යම් වාහනයක්, යාත්‍රාවක්, දුම්රියක්, ගුවන් යානයක් හෝ නියමුවකු රහිත ගුවන් යානයක් ස්වකීය පාලනය යටතට ගැනීමට පොලිස් නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය.

(2) එකී පාලනය යටතට ගැනීම වහාම මහෙස්ත්‍රාත්වරයකු වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

*යාත්‍රාවක් යාත්‍රා කිරීම හෝ ගුවන් යානයක් පිටත්වීම අත්හිටුවීම හෝ පමා කිරීම*

**55.** (1) මේ පනතේ කාර්යය සඳහා, නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින් -

(අ) යම් ගුවන් යානයක් පිටත් වීම හෝ යම් යාත්‍රාවක් යාත්‍රා කිරීම පැය හතළිස් අටක් නොඉක්මවන කාල සීමාවකට අත්හිටුවීම හෝ පමා කිරීම;

(ආ) එවැනි යම් ගුවන් යානයක් නම් කරනු ලැබූ ගුවන් තොටුපලකට හෝ වෙනත් යම් සුදුසු ස්ථානයකට ගොඩබැස්සවීම; හෝ

(ඇ) යම් යාත්‍රාවක් යම් තොටුපලකට හෝ වරායකට හෝ වෙනත් සුදුසු ස්ථානයකට ගෙන ඒම,

සඳහා විධාන නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම ගුවන් යානය හෝ යාත්‍රාව ඇති ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගෙන් ලබාගත් පූර්ව අනුමතයකින් තොරව (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ

කිසිම විධානයක් නිකුත් කරනු නොලැබිය යුතු ය:

එසේම තවදුරටත්, විධානය නිකුත් කරන නිලධරයා, එම විධානය නිකුත් කිරීමට පෙරතුව, ඒ විධානය නිකුත් කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳ සෑහීමට පත් වී, මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රදානය කරන ලද අනුමතයේ යම් කොන්දේසි දක්වා ඇත්නම් එසේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, ඒ විධානය නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ගුවන් ආරක්ෂණ අවසරය ලබා ගැනීමේ කාර්යය සඳහා යම් ගුවන් යානයක් සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ එවැනි යම් විධානයක් පිළිබඳව 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරි පනත යටතේ පත් කරනු ලැබූ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයා වෙත පූර්ව දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකා නාවික හමුදාවේ යාත්‍රාවක් සම්බන්ධයෙන් විධානයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී විධානය පිළිබඳ පූර්ව දැන්වීමක් ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා වෙත ලබා දෙනු ලැබිය යුතු ය.

සායනික වෝහාරික වෛද්‍ය පරීක්ෂණ

**56.** (1) පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවකු හෝ වරදක වින්දිතයකු අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත පරීක්ෂා කිරීම සඳහා ඍජුව ම ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය.

(2) අධිකරණ වෛද්‍ය නිලධරයා විසින්, එම පරීක්ෂණයේ වාර්තාව, සැකකරු ඉදිරිපත් කර ඇති හෝ සැකකරු ඉදිරිපත් කළ යුතු මහෙස්ත්‍රාත්වරයාට පිටපතක් සහිතව, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඍජුව ම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රජයේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් විශේෂඥයකු වෙත අයිතම ඍජුව ම ඉදිරිපත් කිරීම

**57.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම හා සම්බන්ධ විය හැකි බවට ඔහු විසින් සාධාරණව විශ්වාස කරන යම් ලේඛනයක්, දෙයක් හෝ ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා රජයේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය විශේෂඥවරයකු වෙත ඍජුව ම ඉදිරිපත් කිරීමට පොලිස් ස්ථානයක් භාර නිලධරයකු හිමිකම් ලැබිය යුතු ය.

(2) රජයේ රස පරීක්ෂක හෝ වෙනත් විශේෂඥවරයා විසින්, එකී පරීක්ෂණයේ වාර්තාව සැකකරු ඉදිරිපත් කර ඇති හෝ සැකකරු ඉදිරිපත් කළ යුතු මහෙස්ත්‍රාත්වරයාට පිටපතක් සහිතව, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත ඍජුව ම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

විමර්ශනය සඳහා කරුණු ලබා දීම

**58.** (1) වෙනත් නීතිය බලාත්මක කරන ආයතනයක විමර්ශන නිපුණතාවය යටතට ගැනෙන වරදක් සිදු කර තිබෙන බව පෙනෙන කරුණු පවතින බව මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කරන පොලිස් නිලධරයකුගේ අදහස වන්නේ නම්, එම පොලිස් නිලධරයා විසින් එම වෙනත් නීතිය බලාත්මක කරන ආයතනය වෙත විමර්ශනය පිණිස කරුණු ලබා දීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති නීතිය බලාත්මක කරන ආයතනය යන්නට වෙනත් යම් ස්වෛරී රටක ආයතනයක් ඇතුළත් විය හැකි ය.

ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශන

**59.** (1) පොලිස් නිලධරයකු විසින්, පොලිස්පතිවරයාගේ අනුමතය ඇතිව සහ අදාළ විදේශ රටෙන් ලබාගත් පූර්ව අනුමතය ඇතිව, මේ පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත විමර්ශනයක් පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේ ය.

(2) පොලිස්පතිවරයා විසින් බලය ලබා දුන් පොලිස් නිලධරයකු විසින් මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම පිළිබඳව, අදාළ විදේශ රටෙන් හා ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ලබාගත් පූර්ව අනුමතය ඇතිව, වෙනත් යම් රටක අපරාධ විමර්ශන නියෝජිත ආයතනයක් සමඟ ඒකාබද්ධ විමර්ශනයක් කිරීමට භාර ගැනීම හා සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මහජනතාවගේ ආරක්ෂාව සඳහා පොලිසිය විසින් විධාන නිකුත් කළ හැකි බව

**60.** (1) මේ පනත යටතේ වන වරදක් සිදු කරනු ලැබ ඇති බවට හෝ සිදු කිරීමට ඉඩ ඇති බවට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයකුට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකුට විශ්වසනීය තොරතුරක් ලැබුණු අවස්ථාවක දී, පැහැදිලි වූ ද, විද්‍යාමාන වූ ද, අන්තරායක් ඇති බව ද ඒ වරද හා සම්බන්ධ හානි සිදුවීමෙන් හෝ තව තවත් හානි සිදුවීමෙන් තැනැත්තන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන විධාන නිකුත් කිරීම අවශ්‍ය බව ද, ඔහුගේ මතය වන්නේ නම්, ඔහු විසින්, පහත දැක්වෙන විධාන එකක් හෝ කිහිපයක් මහජනතාව වෙත නිකුත් කරනු ලැබිය හැකි ය:-

(අ) යම් නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයකට හෝ පරිශ්‍රයකට ඇතුළු නොවන ලෙස;

(ආ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයකින් හෝ පරිශ්‍රයකින් පිටවන ලෙස;

(ඇ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයකින් හෝ පරිශ්‍රයකින් පිට නොවන ලෙස සහ එකී ප්‍රදේශය හෝ පරිශ්‍රය තුළ රැඳී සිටින ලෙස;

(ඈ) යම් මාර්ගයක ගමන් නොකරන ලෙස;

(ඉ) කිසිවක් ප්‍රවාහනය නොකරන ලෙස හෝ කිසිවකුට ප්‍රවාහන සැපයීම නොකරන ලෙස;

(ඊ) නිශ්චිතව දක්වනු ලබන පොදු ප්‍රවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලෙස;

(උ) යම් ස්ථානයකින් විශේෂ වස්තුවක්, වාහනයක්, යාත්‍රාවක් හෝ ගුවන් යානයක් ඉවත් කරන ලෙස;

(ඌ) වාහනයක්, යාත්‍රාවක්, නැවක් හෝ ගුවන් යානයක් එහි වර්තමාන පිහිටීමෙහි ම තැබීම අවශ්‍ය ලෙස;

(එ) වැඩිදුර දැනුම් දීමක් නිකුත් කරනු ලබන තෙක් යාත්‍රාවක් හෝ නැවක් යම් නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශයක් තුළට යාත්‍රා නොකරන ලෙස;

(ඒ) ගුවන් යානයක්, නිශ්චිතව දක්වනු ලබන ගුවන් අවකාශයක් තුළට හෝ ඉන් පිටත හෝ පියාසර නොකරන ලෙස;

(ඔ) යම් විශේෂ ස්ථානයක ඒකරාශී නොවන ලෙස;

(ඕ) විශේෂ රැස්වීමක්, රැලියක් හෝ පෙළපාලියක් නොපවත්වන ලෙස; සහ

(ක) යම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාකාරකමක නිරත නොවන ලෙස:

එසේ වුව ද, (අ) ඡේදයේ සිට (ක) ඡේදය දක්වා වන ඡේද යටතේ වන කිසිදු විධානයක්, මහෙස්ත්‍රාත්වරයකුගේ පූර්ව අනුමතය ලබා නොගෙන නිකුත් කරනු නොලැබිය යුතු අතර, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ විධානය නිකුත් කිරීමට පෙරාතුව ඒ විධානය නිකුත් කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳ සෑහීමට පත් වී

ඒ විධානය යම් කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබීමට ආඥා කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක් ඒ විධානය නිකුත් කරනු ලැබූ අදාළ නිලධරයා විසින් හෝ (අ) ඡේදයේ සිට (ක) ඡේදය දක්වා වන ඡේද යටතේ එවැනි යම් විධානයක් සඳහා පූර්ව අනුමතය ප්‍රදානය කළ මහෙස්ත්‍රාත්වරයා විසින්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් විධානයක, හදිසි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ද එවැනි යම් විධානයකින් බලපෑමට ලක්විය හැකි තැනැත්තන්ගේ මානුෂීය අවශ්‍යතා සඳහා ද ව්‍යතිරේඛ ඇතුළත් විය හැකි ය.

(4) එවැනි යම් විධානයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර වෙනත් සුදුසු ක්‍රම මගින් අදාළ ප්‍රදේශය තුළ ඊට පුළුල් ප්‍රචාරණයක් ලබා දෙනු ලැබිය යුතු ය.

(5) (අ) එවැනි යම් විධානයක් ක්‍රියාත්මක වන කාලසීමාව, එක් වරක දී අඛණ්ඩව පැය විසි හතරක් නොඉක්මවිය විය යුතු අතර, එහි මුළු කාලසීමාව පැය හැත්තෑ දෙකක් නොඉක්මවිය යුතු ය.

(ආ) එවැනි යම් විධානයක් ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව පැය විසි හතරකට වඩා දීර්ඝ කරනු ලැබීම අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ දීර්ඝ කරනු ලැබූ කාලසීමාව, ඒ විධානය ක්‍රියාත්මක වීමේ මුල් කාලසීමාව අවසන් වීමෙන් පසු, පැය විසි හතරකට නොඅඩු අතරමැදි කාලසීමාවකින් පසු ආරම්භ විය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වන යම් විධානයක් බලාත්මක කිරීම සඳහා, පොලිස්පතිවරයා විසින්, යම් සන්නද්ධ හමුදාවක සාමාජිකයන්ගේ සහාය, අදාළ සන්නද්ධ හමුදාවේ හමුදාපතිවරයාගෙන් ලබාගත් පූර්ව අනුමතය ඇතිව, ලබාගනු ලැබිය හැකි ය.

(7) එවැනි විධානයක් බලාත්මක කිරීමේ කාර්යය සඳහා පොලිස් නිලධරයන් විසින් ඒ ප්‍රදේශය වටකර රැකවල් යෙදීම නීත්‍යානුකූල වන්නේ ය.

(8) ඒ විධානය ක්‍රියාත්මක වීමේ කාලසීමාව තුළ දී සහ ඒ විධාන ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවන් දෙකක් අතර පවතින පැය විසි හතරක අතරමැදි කාලසීමාවක් තුළ දී යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත්කාර්ය සඳහා බලය දෙන ලද යම් සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් පහත දැක්වෙන දේ කිරීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) ඒ විධානය බලාත්මක වන ප්‍රදේශය තුළ දී හමු වූ යම් තැනැත්තකු නතර කිරීම, ප්‍රශ්න කිරීම සහ සෝදිසි කිරීම;

(ආ) යම් පරිශ්‍රයන්ට ඇතුළු වීම සහ සෝදිසි කිරීම; හෝ

(ඇ) ඒ විධානය බලාත්මක වන ප්‍රදේශය තුළට ඇතුළු වීමට හෝ එහි රැඳී සිටීමට තැත් කරන යම් තැනැත්තකු නතර කිරීම සහ ප්‍රශ්න කිරීම සහ ඒ තැනැත්තා හෝ ඒ ප්‍රදේශය තුළට හෝ ඉන් පිටතට ගෙන යනු ලැබිය හැකි ඒ තැනැත්තාට අයත් දේ සහ දේපළ සෝදිසි කිරීම.

(9) මේ වගන්තිය ප්‍රකාරව පවත්වනු ලබන යම් සෝදිසි කිරීමක් ඊට භාජනය වන තැනැත්තාගේ ගරුත්වය හා පෞද්ගලිකත්වය පිළිබඳ නිසි සැලකිල්ල දක්වමින් සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකිලිමත්ව කරනු ලැබිය යුතු අතර, ස්ත්‍රියක් සෝදිසි කිරීම නිලධාරිනියක් විසින් පමණක් සිදු කිරීමට වග බලා ගනු ලැබිය යුතු ය.

(10) විධානයට පටහැනිව ක්‍රියා කළ හැකි යම් තැනැත්තකු වැළැක්වීම සහ සෝදිසි කිරීම පොලිස් නිලධරයකු විසින් හෝ තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ සන්නද්ධ හමුදා සාමාජිකයකු විසින් සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(11) මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට හිතාමතාම පටහැනිව ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, වසර එකක් නොඉක්මවන කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ

එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(12) මේ වගන්තිය යටතේ වන වරදක්, ඒ වරද සිදු කිරීමෙන් වරදකරු හැර වෙනත් තැනැත්තකුගේ ජීවිතයට හානියක් නොවන්නේ නම්, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව ඒ වරද සංඥෙය නොවන වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## V වන කොටස

## විමර්ශන සඳහා වන කරුණු

බැංකු, මූල්‍ය ආයතන යනාදියෙන් තොරතුරු ලබා ගැනීම

**61.** (1) 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධානවලට, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ විධිවිධානවලට සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන තොරතුරු හා කරුණු අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට සපයන ලෙස යම් බැංකුවකට, බැංකුවක් නොවන මූල්‍ය ආයතනයකට හෝ නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාරයකට නියම කරන්නා වූ ආඥාවක් මහෙස්ත්‍රාත්වරයකුගෙන් ඉල්ලා සිටීමට එම නිලධරයාට හිමිකම තිබිය යුතු ය:-

(අ) ඒ බැංකුව, ආයතනය හෝ ව්‍යාපාරය විසින් යම් තැනැත්තකුට සපයනු ලබන යම් මූල්‍ය සේවාවකට අදාළ තොරතුරු;

(ආ) යම් තැනැත්තකු විසින් සිදු කරනු ලැබූ යම් මුදල් ගනුදෙනුවක් පිළිබඳ විස්තර;

(ඇ) බැංකු ගිණුම්, තැන්පතු, ප්‍රේෂණ හා ආපසු ගැනීම් සම්බන්ධ විස්තර සහ එවැනි යම් බැංකුවක්, ආයතනයක් හෝ ව්‍යාපාරයක් විසින් සපයනු ලැබූ මූල්‍ය සේවා පිළිබඳ විස්තර;

(ඈ) යම් තැනැත්තකු විසින් මූල්‍ය සේවා සුරක්ෂිත කිරීම සම්බන්ධ විස්තර; හෝ

(ඉ) යම් ගිණුමක සහතික කරනු ලැබූ ප්‍රකාශයක් හෝ යම් ගිණුමකට හෝ ගනුදෙනුවකට අදාළ වෙනත් තොරතුරක්:

එසේ වුව ද, මේ පනත යටතේ වරදක් කරන ලද බවට යම් තැනැත්තකුට එරෙහිව සැක කිරීමට සාධාරණ හේතු පවතින්නේ නම් පමණක්, මේ වගන්තිය යටතේ ආඥාවක් කිරීම සඳහා ඉල්ලා සිටීමට එවැනි පොලිස් නිලධරයකුට හිමිකම ඇත්තේ ය.

(2) ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ පොලිස් නිලධරයා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, විමර්ශනය පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ යයි ද, අවශ්‍ය වේ යයි ද පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම් ඉල්ලීමට අදාළ නඩු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත් ව රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

සේවා සපය-න්නන්ගෙන් තොරතුරු ලබා ගැනීම

**62.** (1) අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට, විදුලි සංදේශ, චන්ද්‍රිකා හෝ ඩිජිටල් සේවා හෝ දත්ත සේවා සපයන්නකුට -

(අ) ඒ සේවා සපයන්නා විසින් යම් තැනැත්තකුට සපයන ලද හෝ සපයමින් පවතින සේවාවන්ට අදාළ තොරතුරු;

(ආ) ඒ සේවාවන් ලබා දී ඇත්තේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා විසින් භුක්ති විඳිනු ලබන සේවාවන්ට අදාළ තොරතුරු;

(ඇ) ඒ සේවා සපයන්නා විසින් ගබඩා කරනු ලැබිය හැකි, ලේඛනාගාරගත කළ හැකි හෝ අන්‍යාකාරයකින් තබා ගත හැකි යම් තොරතුරක්, දත්තයක් හෝ ලේඛනයක් හෝ වාර්තාවක්; සහ

(ඈ) ඒ සේවා සපයන්නා විසින් සපයන ලද සේවාව හරහා යම් උපකරණයකට හෝ යම් උපකරණයකින් දත්ත හෝ තොරතුරු උඩුගත කිරීමට සහ බාගත කිරීමට අදාළ තොරතුරු,

ඇතුළත් තොරතුරු ඒ පොලිස් නිලධරයාට සපයන ලෙස නියම කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකුගෙන් ආඥාවක් කිරීම සඳහා ඉල්ලා සිටීමට හිමිකම තිබිය යුතු ය.

එසේ වුව ද, මේ පනත යටතේ වරදක් කරන ලද බව යම් තැනැත්තකුට එරෙහිව සැක කිරීමට සාධාරණ හේතු පවතින්නේ නම් පමණක්, මේ වගන්තිය යටතේ ආඥාවක් කිරීම සඳහා ඉල්ලා සිටීමට එවැනි පොලිස් නිලධරයකුට හිමිකම ඇත්තේ ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පොලිස් නිලධරයා විසින් සිදු කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, විමර්ශනය පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ වේ යයි ද, අවශ්‍ය වේ යයි ද, පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ඒ පොලිස් නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම්, ඉල්ලීමට අදාළ නඩු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත් ව රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

රජයෙන් හෝ ව්‍යවස්ථාපිත ආයතනවලින් තොරතුරු ලබා ගැනීම

**63.** (1) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා යම් තොරතුරක් හෝ ලේඛනයක් ලබා දෙන ලෙස පහත දැක්වෙන නිලධරයන්ට නියම කරමින් ආඥාවක් කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකුගෙන් ඉල්ලා සිටීමට අදාළ පොලිස් ස්ථානය භාර පොලිස් නිලධරයා හිමිකම තිබිය යුතු ය:-

(අ) යම් අමාත්‍යවරයකුගේ අමාත්‍යාංශයක ලේකම්වරයෙක්;

(ආ) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඇ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා;

(ඈ) මහ බැංකුවේ අධිපතිවරයා;

(ඉ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා;

(ඊ) මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා;

(උ) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඌ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(එ) ආගමන සහ විගමන පාලක ජනරාල්වරයා;

(ඒ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා;

(ඔ) ආනයන සහ අපනයන පාලක ජනරාල්වරයා;

(ඕ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා;

(ක) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා;

(ග) ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ච) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා;

(ජ) මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල්වරයා;

(ට) විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඩ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් ආණ්ඩුවේ ආයතනයක ප්‍රධානයෙක්; හෝ

(ණ) පළාත් සභාවක සභාපති හෝ පළාත් පාලන ආයතනයක සභාපති හෝ විශේෂ කොමසාරිස්වරයෙක්.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පොලිස් නිලධරයා විසින් සිදු කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, විමර්ශනයක් පැවැත්වීම සඳහා ඒ ආඥාව කිරීම සාධාරණ යයි ද, අවශ්‍ය වේ යයි ද, පෙනී යන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීම සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, ඒ පොලිස්

නිලධරයා විසින් ඉල්ලා සිටින්නේ නම්, ඉල්ලීමට අදාළ නඩු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 වන ව්‍යවස්ථාවට යටත් ව, රහසිගතව පවත්වනු ලැබිය යුතු ය.

## **VI** වන කොටස

### විමර්ශනවලට පහසුකම් සැලසීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා නිකුත් කළ යුතු බව

*මහේස්ත්‍රාත්-වරයා විසින් ස්ථානයක් භාර පොලිස් නිලධරයකුගේ ඉල්ලීමක් මත ආඥා නිකුත් කළ යුතු බව*

**64.** (1) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමේ කාර්යය සඳහා, පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් -

(අ) සැකකරුවකු ශ්‍රී ලංකාවෙන් පිටතට ගමන් කිරීම වැළැක්වීම;

(ආ) යම් තැනැත්තකුගේ රුධිරය, හිසකෙස් සාම්පල, තෙත මාත්තුකඩ සහ ඇඟිලි සලකුණු ඇතුළු ජෛවමිතික දත්ත ලබා ගැනීම;

(ඇ) හඳුනා ගැනීමේ පෙරෙට්ටු පැවැත්වීම;

(ඈ) නඩු භාණ්ඩ රජයේ රස පරීක්ෂක වෙත හෝ වෙනත් යම් දේශීය හෝ විදේශීය විශේෂඥයකු වෙත හෝ රජයේ වෝහාරික වෛද්‍ය විශේෂඥයකු වෙත ඉදිරිපත් කිරීම;

(ඉ) විශේෂඥයන් විසින් අදාළ පරීක්ෂණ සහ පිරික්සුම් පැවැත්වීම;

(ඊ) පනවනු ලැබිය හැකි යම් කොන්දේසියකට යටත්ව බැංකු ගිණුම් ක්‍රියාවිරහිත කිරීම හෝ වෙනත් මූල්‍ය තැන්පතු සහ ගිණුම් ක්‍රියාවිරහිත කිරීම:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, ස්වකීය මෙහෙයවීම යටතේ හෝ තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත, ඒ ආඥාව වෙනස් කිරීම හෝ සද්භාවයෙන් යම් නීත්‍යානුකූල කාර්යයක් සඳහා ඒ ගිණුමේ හිමිකරුට ඒ

ගිණුමෙහි අරමුදල් භාවිත කිරීමට අවසර ලබා දීම කරනු ලැබිය හැකි ය;

(ඌ) යම් සේවා සපයන්නකු විසින් සපයනු ලබන සේවා සැපයීම අත්හිටුවීම හෝ වෙනස් කිරීම:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, ස්වකීය මෙහෙයවීම යටතේ හෝ තත් කාර්ය සඳහා කරන ලද ඉල්ලීමක් මත, යම් නීත්‍යනුකූල කාර්යයක් සඳහා එවැනි සේවාවක් ලබා ගන්නා තැනැත්තකුට සද්භාවයෙන් ඒ සේවා භාවිත කිරීමට හැකි කරවනු ලබමින් ඒ ආඥාව වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඍ) සේප්පු විවෘත කිරීම,

යන කාරණා ද ඇතුළුව එම විමර්ශනයට පහසුකම් සැපයීම සඳහා ආඥාව නිකුත් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, ඉල්ලීම සද්භාවයෙන් කර ඇති බවට සහ විමර්ශන පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමේ කාර්යය සඳහා ඉල්ලා ඇති සහාය සාධාරණ ලෙස අවශ්‍ය බවට සෑහීමට පත්වීමෙන් පසුව, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලා ඇති ආඥාව කරනු ලැබිය යුතු ය.

දත්ත සහ තොරතුරු අගුළු විවර කිරීම සඳහා මහෙස්ත්‍රාත්-වරයා විසින් අවසර ලබා දිය යුතු බව

**65.** (1) (2) වන උපවගන්තියේ දක්වා ඇති කාර්ය සඳහා, පොලිස් අධිකාරීවරයකුට නොඅඩු නිලයක් දරන්නා වූ පොලිස් නිලධරයකු විසින් -

(අ) යම් දත්තවල හෝ තොරතුරුවල හෝ වෙනත් දෙයක සන්නිවේදනය හෝ ගබඩා කිරීම හෝ උපකරණ අගුළු දැමීමේ හෝ කේත යෙදීමේ සේවා සපයනු ලබන යම් තැනැත්තකුට ඒ සේවාවේ අගුළු හෝ කේත විවර කර එහි අඩංගු තොරතුරු ඒ පොලිස් නිලධරයාට සැපයීමට විධාන කිරීමට;

(ආ) යම් තැපැල් පණිවිඩයකට හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයකට හෝ යම් දුරකතනයකට, හඬ පටයකට, අන්තර්ජාල හෝ වීඩියෝ කථාබහකට හෝ සංවාදයකට හෝ වෙනත් යම් මාධ්‍යයක් හරහා කෙරෙන වෙනත් සන්නිවේදනයකට බාධා කිරීමට, කියවීමට, සවන් දීමට හෝ පටිගත කිරීමට; හෝ

(ඇ) ඇනලොග් හෝ ඩිජිටල් දත්ත හෝ තොරතුරු හුවමාරු හෝ මාරු කිරීමේ පද්ධතියකට ප්‍රවේශ වීමට,

ඒ නිලධරයාට අවසර ලබා දෙමින් ආඥාවක් කරන ලෙස ඉල්ලා සිටිමින් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ පනත යටතේ වරදක් කරන ලද බවට සැක කිරීමට යම් තැනැත්තකුට එරෙහිව සාධාරණ හේතු පවතින්නේ නම් පමණක්, මේ වගන්තිය යටතේ ආඥාවක් කිරීම සඳහා ඉල්ලා සිටීමට එවැනි පොලිස් නිලධරයකුට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැක්කේ -

(අ) මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති තැනැත්තකුගේ අනන්‍යතාවය නිශ්චය කිරීම;

(ආ) මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති තැනැත්තකු සිටින ස්ථානය නිශ්චය කිරීම;

(ඇ) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමට පහසුකම් සැලසීම;

(ඈ) මේ පනත යටතේ වන වරදක් සිදු කර ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂි එකතු කිරීම;

(ඉ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි සංඛ්‍යාවක් විසින් කුමන්ත්‍රණය කරන්නේ ද, සැලසුම් කරන්නේ ද, සූදානම් වන්නේ ද, හෝ තැත් කරන්නේ ද යන්න නිශ්චය කිරීම;

(ඊ) මේ පනත යටතේ වන වරදක් සිදු කිරීම වැළැක්වීමට පියවර ගැනීම.

යන කාරණා සඳහා වන්නේ ය.

(3) ඉල්ලීම කරන ලද්දේ සද්භාවයෙන් බවටත් ඒ ආඥාව කිරීම විමර්ශන පැවැත්වීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන බවටත්, ඔහු සෑහීමට පත්වන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ ආඥාව නිකුත් කරනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්-වරයා විසින් ප්‍රකාශ සටහන් කරගත යුතු බව

**66.** (1) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වනු ලබන පොලිස් ස්ථානයක් භාර නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමක් මත, එකී ඉල්ලීම කරන ලද්දේ යම් මහෙස්ත්‍රාත්වරයෙක් වෙත ද, එම මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට ඒ නිලධරයා විසින් ඉදිරිපත් කරන ලද යම් සැකකරුවකුගෙන්, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කර ප්‍රකාශයක් සටහන් කරගනු ලැබිය හැකි ය.

(2) එකී ප්‍රකාශය සටහන් කර ගැනීම පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූලව කරනු ලැබිය යුතු ය:-

(අ) මේ පනත යටතේ වන සැකකරුගේ අයිතිවාසිකම් පිළිබඳ ඒ තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු ය;

(ආ) සැකකරුට යොමු කරනු ලබන ප්‍රශ්නවලට ස්වේච්ඡාවෙන් ම පිළිතුරු සැපයීමට එකී තැනැත්තා අපේක්ෂා කරනු ලබන්නේ ද යන්න විනිශ්චය කර ගැනීමට ඒ තැනැත්තාගෙන් ඒ පිළිබඳ විමසනු ලැබිය යුතු අතර, කිසිදු පොරොන්දුවකින්, පෙලඹවීමකින් හෝ තර්ජනයකින් තොරව එකී තැනැත්තා

විසින් ස්වේච්ඡාවෙන් එකී ප්‍රකාශය සිදු කරන බවට සෑහීමට පත්වන්නේ නම් පමණක්, මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට කටයුතු කරනු ලැබිය යුතු ය;

(ඇ) ඒ තැනැත්තාගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා පොලිස් ස්ථානය භාර නිලධරයාගෙන් ප්‍රශ්නාවලියක් ලබා ගත යුතු ය;

(ඈ) සැකකරුට එරෙහිව අපරාධ නඩු කටයුතු පවරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් සිදු කරනු ලබන ප්‍රකාශයේ ඇතුළත් දේ, ඔහුට එරෙහිව සාක්ෂි වශයෙන් භාවිත කරනු ලැබිය හැකි බවට ඒ තැනැත්තාට පූර්ව දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය;

(ඉ) සැකකරුට යොමු කරන ලද ප්‍රශ්න සඳහා ලබා දෙන ලද පිළිතුරුවලට අමතරව, එකී තැනැත්තා විසින් පැවසීමට අපේක්ෂා කරනු ලබන කවර වූ හෝ ප්‍රකාශයක් සටහන් කරගනු ලැබිය යුතු ය;

(ඊ) සම්මුඛ සාකච්ඡාවට භාජනය කරනු ලබන තැනැත්තාට මහෙස්ත්‍රාත්වරයා කථා කරන භාෂාව නොවැටහෙන අවස්ථාවක දී, ප්‍රශ්න සහ පිළිතුරු එකී තැනැත්තාට සහ මහෙස්ත්‍රාත්වරයාට වැටහෙන භාෂාවලට පරිවර්තනය කිරීම සඳහා භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබා ගනු ලැබිය යුතු ය; සහ

(උ) අනාගතයේදී සත්‍යායනය කිරීම සඳහා සම්මුඛ සාකච්ඡාවේ පිටපතක් සහ එහි වීඩියෝ පටිගත කිරීමක් සකස් කර තබා ගත යුතු ය.

(3) එකී ප්‍රකාශය ලබා දෙන තැනැත්තා මේ පනත යටතේ වරදක් කිරීම හේතුවෙන් තදනන්තරව අධිචෝදනා ලබා ඇති අවස්ථාවක, 78 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට සහ සාක්ෂි ආඥා පනතේ 24 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එකී වරද සම්බන්ධයෙන් වන

නඩු කටයුතුවල දී එකී ප්‍රකාශය එකී තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගත යුතු ය.

(4) මේ පනත යටතේ වන වරදක් කිරීම සම්බන්ධයෙන් අධිචෝදනා ලබා ඇති තැනැත්තකුට එරෙහිව සාක්ෂිකරුවකු වශයෙන් සාක්ෂි ලබා ගැනීමට ප්‍රකාශය ලබා දෙන තැනැත්තා නීතිපතිවරයා විසින් කැඳවනු ලබන අවස්ථාවක දී, එකී සම්පූර්ණ ප්‍රකාශයම හෝ ඉන් කොටසක් ලකුණු කර එකී තැනැත්තා සම්බන්ධ මුල් ප්‍රශ්න කිරීමේ කොටසක් ලෙස සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) (අ) සැකකරු විසින් ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් එම කරුණු අදාළ පොලිස් නිලධරයාට සන්නිවේදනය කළ යුතු ය.

(ආ) සැකකරු විසින් ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවේ දී, ඔහු රඳවා තැබීමේ නියමයක් ප්‍රකාරව රඳවා තබා සිටින්නේ නම් නැතහොත් රිමාන්ඩ් භාරයේ සිටින්නේ නම්, ඔහු, අවස්ථාවෝචිත පරිදි, රඳවා තබනු ලැබීම සඳහා හෝ රිමාන්ඩ් භාරයට ආපසු යවනු ලැබිය යුතු ය.

විමර්ශන සම්පූර්ණ කිරීම

**67.** (1) විමර්ශනය සම්පූර්ණ කරන ලද විට දී, අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින්, විමර්ශනය සම්පූර්ණ කිරීම පිළිබඳ දැනුම් දෙමින් මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) විමර්ශනය සම්පූර්ණ කර ඇත්තේ යම් සැකකරුවෙක් සම්බන්ධයෙන් ද, එවැනි සැකකරුවකු සම්බන්ධයෙන් මේ පනත යටතේ රඳවා තැබීමේ නියමයක් නිකුත් කිරීම හෝ එවැනි නියමයක් දීර්ඝ කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) යම් අවස්ථාවක දී, මේ පනත යටතේ සිරභාරයට ගන්නා ලද යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් වන විමර්ශනයක් නැවත ආරම්භ කළ යුතු වන්නේ නම්, එකී වැඩිදුර විමර්ශන නැවත ආරම්භ කිරීම සහ සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයා සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කරනු ලැබිය යුතු ය.

විමර්ශනවල සටහන්

**68.** විමර්ශනය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, විමර්ශන සටහන් නීතිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්

නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## VII වන කොටස

## අපරාධ නඩු කටයුතු ආරම්භ කිරීම

නීතිපතිවරයා විසින් නඩු පැවරිය යුතු බව

**69.** යම් තැනැත්තකු විසින් සිදු කරන ලද මේ පනත යටතේ වන වරදක් හෝ මේ පනත යටතේ එකී වරද සිදු කිරීමේ ක්‍රියාවලිය අතරතුර එකී තැනැත්තා විසින් සිදු කරන ලද වෙනත් යම් නීතියක් යටතේ වන වරදක් සම්බන්ධයෙන්, නීතිපතිවරයා විසින් අධිචෝදනා ඉදිරිපත් කිරීම සහ අපරාධ නඩු පැවරීම, භාර ගැනීම හෝ කරගෙන යාම කරනු ලැබිය හැකි ය.

අධිචෝදනා කිරීම අත්හිටුවීම සහ කල් තැබීම

**70.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, -

(අ) යම් තැනැත්තකුට මරණය හෝ බරපතළ තුවාල සිදු වී නොමැති විට දී; හෝ

(ආ) රාජ්‍යයේ සහ ශ්‍රී ලාංකික ජනතාවගේ ආරක්ෂාව දැඩි ලෙස අන්තරායකට හෝ බලපෑමකට ලක් වී නොමැති විට දී,

නීතිපතිවරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වමින් සහ (3) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි එකකට හෝ වැඩි ගණනකට යටත් ව, මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි කියනු ලබන යම් තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු පැවරීම වසර විස්සක් නොඉක්මවන කාල සීමාවක් සඳහා අත්හිටුවීම සහ කල් තැබීම කරනු ලැබිය හැකි ය.

(2) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අපරාධ නඩු පැවරීම අත්හිටුවීම හෝ කල් තැබීම කරනු ලබන විට දී, ඔහු විසින් -

(අ) රාජ්‍ය ප්‍රතිපත්තිය;

(ආ) ජාතික යහපත සහ මහජන යහපත;

(ඇ) පොලිස්පතිවරයාගේ අදහස්;

(ඈ) වරදේ වින්දිතයන්ගේ අදහස්; සහ

(ඉ) චූදිත තැනැත්තා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් සිදු කරනු ලැබිය හැකි කරුණු දැක්වීම්,

සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වරදක් සිදු කරන ලදැයි කියනු ලබන තැනැත්තකුට එරෙහිව අපරාධ නඩු පැවරීම, (1) වන උපවගන්තිය ප්‍රකාරව අත්හිටුවීමට සහ කල් තැබීමට නීතිපතිවරයා විසින් තීරණය කර ඇති අවස්ථාවක දී, ඒ තැනැත්තාට එරෙහිව අපරාධ නඩු පැවරීම අත්හිටුවීමට සහ කල් තැබීමට ප්‍රතිෂ්ඨාවක් වශයෙන්, පහත දැක්වෙන කොන්දේසි එකක් හෝ වැඩි සංඛ්‍යාවක් එම තැනැත්තාට පැනවීමට මහාධිකරණයේ අවසරය ලබා ගැනීම සඳහා වන ඉල්ලීමක් නීතිපතිවරයා විසින්, මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:-

(අ) මහාධිකරණය විසින් දෙනු ලබන උපදෙස් පරිදි නීතිපතිවරයා විසින් නිකුත් කරනු ලබන භාෂා පාඨයක් භාවිත කරමින් මහාධිකරණය ඉදිරියේ, ප්‍රසිද්ධියේ පසුතැවිල්ල ප්‍රකාශ කිරීම සහ සමාව ඉල්ලීම;

(ආ) නීතිපතිවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි වරදේ වින්දිතයන්ට හානිපූරණය ලබා දීම;

(ඇ) නිශ්චිතව දක්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට සහභාගී වීම;

(ඈ) ඒ තැනැත්තා මේ පනත යටතේ වරදක් කිරීමෙන් වැළකෙන බවට ප්‍රසිද්ධියේ සහතික වීම;

(ඉ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රජා හෝ සමාජ සේවාවක නිරත වීම; හෝ

(ඊ) යම් අධිචෝදනීය වරදක් හෝ සාමය කඩ කිරීමක් සිදු කිරීමෙන් වැළකී සිටීම.

(4) මහාධිකරණය විසින්, (3) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා විසින් කරන ලද ඉල්ලීම සලකා බැලීමෙන් පසුව, වරද කරන ලදැයි කියනු ලබන තැනැත්තාට අධිකරණය ඉදිරියේ පෙනී සිටින ලෙස ආඥාවක් කරනු ලබන යුතු අතර, අධිකරණය විසින් පනවන ලද කොන්දේසි පිළිබඳ ඒ තැනැත්තාට දැනුම් දෙනු ලැබිය යුතු ය. තව ද, කරුණු දැක්වීමට සහ අධිකරණය විසින් එසේ පනවන ලද කොන්දේසිවලට කැමැත්ත පළ කිරීමට, මහාධිකරණය විසින්, එකී තැනැත්තාට අවස්ථාවක් ලබා දෙනු ලැබිය යුතු ය.

(5) ඒ තැනැත්තා විසින් (4) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසි සපුරාලීමට දෙන ලද කාලසීමාව ඇතුළත ඒ කොන්දේසි සපුරාලන්නේ නම්, සිදු කරන ලදැයි කියනු ලබන වරද සම්බන්ධයෙන් එකී තැනැත්තාට එරෙහිව නීතිපතිවරයා විසින් අපරාධ නඩු කටයුතු පවරනු නොලැබිය යුතු ය.

(6) වලංගු නිදහසට කරුණකින් තොරව එකී කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කිරීම ඒ තැනැත්තා පැහැර හරින්නේ නම්, ඒ කොන්දේසි ඉටු කිරීමට ඔහුට ලබා දී ඇති කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, නීතිපතිවරයා විසින් එම තැනැත්තාට දැන්වීමක් කර, ඔහුට එරෙහිව අපරාධ නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

## VIII වන කොටස

### නඩු විභාගය

මහාධිකරණයේ නඩු විභාගය

71. මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම, ජූරි සභාවක් නොමැතිව විනිශ්චයාසනාරූඪ වන මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියේ නීතිපතිවරයා විසින් පවරනු ලබන අධිචෝදනාවක් මත මූලික පරීක්ෂණයකින් තොරව, නඩු විභාගයට භාජනය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, -

(අ) නීතිපතිවරයා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව ත්‍රි පුද්ගල මහාධිකරණයක් ඉදිරියේ නඩු විභාගය

පවත්වන ලෙස අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් ඉල්ලා සිටින අවස්ථාවක දී;

(ආ) යුක්තිය ඉටු කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය වන බව අග්‍රවිනිශ්චයකාරවරයාගේ මතය වන අවස්ථාවක දී; හෝ

(ඇ) චූදිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් එසේ කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී,

අග්‍රවිනිශ්චයකාරවරයා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව විශේෂ මහාධිකරණයක් ඉදිරියේ නඩු විභාගය පැවැත්විය යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය.

නඩු විභාගය අවසන් වන තෙක් රඳවා තැබීම

**72.** (1) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්,

(අ) ජාතික ආරක්ෂාවේ සහ මහජන සාමයේ යහපත උදෙසා එසේ කිරීම අවශ්‍ය බව හෝ යෝග්‍ය බව ඔහුගේ මතය වන අවස්ථාවක; සහ

(ආ) ඒ තැනැත්තා සම්බන්ධයෙන් සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමට වගබලා ගැනීම සඳහා මහාධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට යටත්ව,

ජාතික ආරක්ෂාවේ සහ මහජන සාමයේ යහපත සැලකිල්ලට ගනිමින් මහාධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව යම් බලධරයකුගේ භාරයේ, යම් ස්ථානයක ඒ තැනැත්තා තැබීමට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් නියමයක් මහාධිකරණයට සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට සන්නිවේදනය කරනු ලැබිය යුතු අතර, එම නියමයේ නිශ්චිතව දක්වා ඇති බලධරයාට එම තැනැත්තා භාර කිරීම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය විය යුතු අතර, (54 වන අධිකාරය වූ) බන්ධනාගාර ආඥාපනතේ විධිවිධාන එම තැනැත්තාගේ භාරය සම්බන්ධයෙන් අදාළ වීම අවසන් විය යුතු ය.

*මේ පනත යටතේ වන නඩු කටයුතු සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ලබා දිය යුතු බව*

**73.** අධිකරණයේ මතය අනුව වෙනත් අධිකරණ කටයුත්තක හදිසි තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් වළක්වනු ලබන්නේ නම් මිස, මේ පනත යටතේ වූ වැරදි සම්බන්ධ නඩුකටයුතුවලට අධිකරණයේ වෙනත් යම් අධිකරණ කටයුතු අභිබවා ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

*නඩු විභාගයක කාර්ය පටිපාටිය*

**74.** මේ පනතේ විධිවිධානවලට යටත් ව, අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනත යටතේ වන නඩු විභාගයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*අධිචෝදනාවක් ඉල්ලා අස්කර ගැනීම*

**75.** (1) මේ පනත යටතේ වූ යම් වරදක් හෝ වැරදි එකකට වඩා වැඩි ගණනක් සම්බන්ධයෙන් අධිචෝදනා නගනු ලැබූ යම් තැනැත්තකුට එරෙහිව මහාධිකරණය විසින් නඩු තීන්දුව ලබා දීමට පෙර, කවර අවස්ථාවක දී වුව ද, එම අධිචෝදනාවේ කිසිදු චෝදනාවක් -

(අ) යම් තැනැත්තකුගේ මරණය සිදු කිරීමට හෝ යම් තැනැත්තකුට බරපතළ තුවාල සිදු කිරීමට සම්බන්ධ නොවන;

(ආ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂාවට සහ ජනතාවගේ ආරක්ෂාවට තර්ජනයක් ඇති කිරීමට සම්බන්ධ නොවන; හෝ

(ඇ) දේපළවලට බරපතළ හානි සිදු කිරීමට සම්බන්ධ නොවන,

අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වමින් සහ (3) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි එකක් හෝ වැඩි ගණනකට යටත්ව, මහාධිකරණයේ අවසරය ඇතිව, චූදිතයාට එරෙහිව නගන ලද අධිචෝදනාව ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය.

(2) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ අධිචෝදනාව ඉල්ලා අස්කර ගනු ලබන අවස්ථාවකදී ඔහු විසින් වරදේ වින්දිතයන්ගේ අදහස් සහ චූදිත තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ නීතිඥවරයා විසින් කරනු ලැබිය හැකි කරුණු දැක්වීම් සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

(3) නීතිපතිවරයා විසින් (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ පහත දැක්වෙන කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් පනවනු ලැබිය හැකි ය:-

(අ) නීතිපතිවරයා විසින් නිකුත් කරනු ලබන භාෂා පාඨයක් භාවිත කරමින්, මහාධිකරණය ඉදිරියේ ප්‍රසිද්ධියේ පසුතැවිල්ල ප්‍රකාශ කිරීම සහ සමාව ඉල්ලීම;

(ආ) නීතිපතිවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි, වරදේ වින්දිතයන්හට හානිපූරණය ලබා දීම;

(ඇ) නිශ්චිතව දක්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට ස්වේච්ඡාවෙන් සහභාගී වීම;

(ඈ) මේ පනත යටතේ හෝ වෙනත් නීතියක් යටතේ තමා වරදක් කිරීමෙන් වැළකෙන බවට ප්‍රසිද්ධියේ සහතික වීම;

(ඉ) නිශ්චිතව දක්වනු ලබන ප්‍රජා හෝ සමාජ සේවයක නිරත වීම; සහ

(ඊ) යම් අධිචෝදනීය වරදක් හෝ සාමය කඩ කිරීමක් සිදු කිරීමෙන් වැළකී සිටීම.

(4) එකී තැනැත්තා විසින්, (3) වන උපවගන්තිය යටතේ පනවන ලද කොන්දේසි, එම කොන්දේසි ඉටු කිරීම සඳහා නියම කරන ලද කාලසීමාව තුළ සපුරාලන්නේ නම්, නීතිපතිවරයා විසින් චූදිතයාට එරෙහිව මුල් අධිචෝදනාවේ චෝදනා මත ම අලුත් අධිචෝදනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

(5) චූදිතයා විසින්, වලංගු නිදහසට කරුණක් නොමැතිව එකී කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින්නේ නම්, නීතිපතිවරයා විසින්, චූදිතයාට එරෙහිව මුල් අධිචෝදනාවේ චෝදනා මතම අලුත් අධිචෝදනාවක් ඉදිරිපත් කර, චූදිතයාට එම කොන්දේසි ඉටු කිරීමට ලබා දී ඇති කාලය ඉකුත්වීමෙන් පසු ව චූදිතයාට එරෙහිව නඩු පැවරීම කරනු ලැබිය හැකි ය.

**76.** මේ පනතේ විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ තබන ලද හෝ රඳවා රිමාන්ඩ් භාරයේ තබන ලද හෝ රඳවා

තබන ලද තැනැත්තකුට එරෙහිව ඇති නඩු විභාගය අත්අඩංගුවට පත් කරන ලද දින සිට මාස දොළහක් ඉකුත්වීමෙන් පසුව ද ආරම්භ වී නොමැති නම්, සැකකරු හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත අභියාචනාධිකරණය විසින් ඒ තැනැත්තා ඇප මත මුදා හරිනු ලැබිය හැකි ය:

තබන ලද තැනැත්තකුට ඇප ලබා දීම

එසේ වුව ද, මහාධිකරණයට විශේෂ අවස්ථානුගත කරුණුවලදී මහාධිකරණය විසින් සුදුසු යයි සලකනු ලබන යම් කොන්දේසිවලට යටත් ව, සැකකරු ඇප මත මුදාහැරිය හැකි ය:

එසේ ම තවදුරටත්, අධිචෝදනා පත්‍රය ඉදිරිපත් කර මහාධිකරණයට ගොනු කර ඇති චූදිතයකුට එරෙහි නඩු විභාගය, එසේ ගොනු කළ දින සිට මාස දොළහක් ඉකුත් වීමෙන් පසුව ද ආරම්භ වී නොමැති නම් චූදිතයා හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකු විසින් තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත ඒ තැනැත්තා ඇප මත මුදා හරිනු ලැබීම සම්බන්ධයෙන් මහාධිකරණය විසින් සලකා බලනු ලැබිය හැකි ය.

## **IX** වන කොටස

### ප්‍රකාශවල ආවේශ්‍යතාව

මහෙස්ත්‍රාත්-වරයකුට ලබා දෙනු ලබන ප්‍රකාශ

77. (1) මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකුට ලබා දෙනු ලබන යම් ප්‍රකාශයක්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට සහ සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව එම තැනැත්තාට එරෙහිව ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

(2) (අ) වරදක් තමා විසින් කළ බව ගම්‍යමාන වන හෝ අපරාධාරෝපණය කරන ප්‍රකාශයක් ලබාදීමට හෝ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කිසිදු තැනැත්තකු නීත්‍යානුකූලව බැඳී නොසිටින්නේ ය.

(ආ) සම්මුඛ සාකච්ඡාවකට භාජනය විය යුතු සහ ඔහුගේ ප්‍රකාශය සටහන් කර ගනු ලැබිය යුතු යම් තැනැත්තකු ට, ඔහු කැමති නම් එවැනි සම්මුඛ සාකච්ඡාවකට පෙර නීතිඥවරයකු මුණගැසීමට හෝ නීතිඥවරයකු සමඟ සන්නිවේදනය කිරීමට සහ නීති උපදෙස් ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(ඈ) ප්‍රකාශයක් සටහන් කර ගැනීමට අපේක්ෂා කරන මහෙස්ත්‍රාත්වරයකු විසින්, මේ පනත යටතේ සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තාට එකී සම්මුඛ සාකච්ඡාවට පෙරාතුව එම තැනැත්තාට ඇති අයිතිවාසිකම් පිළිබඳ ව ඒ තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු ය.

(ඇ) සම්මුඛ සාකච්ඡාවේ දී ප්‍රකාශය සටහන් කර ගනු ලබන්නේ යම් තැනැත්තකුගේ ද, ඒ තැනැත්තාට සම්මුඛ සාකච්ජාවේ දී කතා කරන භාෂාව තේරුම් ගැනීමට නොහැකි නම්, භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබාගත යුතු අතර, සම්මුඛ සාකච්ඡාව එම තැනැත්තාට තේරුම්ගත හැකි භාෂාවකින් පවත්වනු ලැබිය යුතු ය.

(ඉ) ප්‍රකාශයේ පරිවර්තනයක් අනුරූපී ප්‍රශ්න සමග අනුපිටපත් කරනු ලැබිය යුතු අතර, අනාගතයේ දී සත්‍යායනය කිරීම සඳහා තබාගනු ලැබිය යුතු ය.

(ඊ) හැකි කවර වූ හෝ අවස්ථාවක දී සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් පටිගතකර තබනු ලැබිය යුතු ය.

මහෙස්ත්‍රාත්-වරයකු වෙත කරනු ලැබූ ප්‍රකාශයක ආවේශ්‍යතාව සම්බන්ධයෙන් සෑහීමට පත්විය යුතු පූර්ව කොන්දේසි

78. වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වරදක් සිදු කර තිබීම සම්බන්ධයෙන් චෝදනා ලත් තැනැත්තකු විසින් මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ප්‍රකාශයක් -

(අ) එවැනි ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලද මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙරාතුව ම සහ ඉන් ඉක්බිතිවම ප්‍රකාශය කරන ලද තැනැත්තා රජයේ වෝහාරික වෛද්‍ය විශේෂඥයකුගේ පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු සලස්වන්නේ නම් මිස; සහ

(ආ) ප්‍රකාශයේ ආවේශ්‍යතාව තහවුරු කර ගැනීම සඳහා මෙහෙයවනු ලැබිය හැකි, ප්‍රාථමික ශක්නුතා පරීක්ෂණය අතරතුර, වෝහාරික වෛද්‍ය විශේෂඥයාගේ වාර්තාව නඩු පවරන බලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස,

එම තැනැත්තාට එරෙහිව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කර ගනු නොලැබිය යුතු ය.

## X වන කොටස

## විවිධ නියම

ජනාධිපතිවරයා විසින් තහනම් නියම නිකුත් කරනු ලැබිය හැකි බව

79. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වරදකට හේතු වන ක්‍රියාවක යම් සංවිධානයක් නිරත වී සිටින බවට හෝ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක ආරක්ෂාවට අගතිගාමී වන ආකාරයට නීති විරෝධී ලෙස ක්‍රියා කරමින් සිටින බවට විශ්වාස කිරීමට ජනාධිපතිවරයාට සාධාරණ හේතු පවතින අවස්ථාවක, ජනාධිපතිවරයා විසින්, (මින් මතු "තහනම් නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, මේ පනතේ විධිවිධාන ප්‍රකාර ඒ සංවිධානය තහනම් කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් -

(අ) පොලිස්පතිවරයා විසින් කරන ලද නිර්දේශයක් බලාත්මක කිරීම සඳහා; හෝ

(ආ) යම් විදේශ රටක ආණ්ඩුව විසින් ශ්‍රී ලංකා ආණ්ඩුව කරන ලද ඉල්ලීමක් බලාත්මක කිරීම සඳහා,

තහනම් නියමයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) තහනම් නියමයක පහත දැක්වෙන තහනම් කිරීම් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් ඇතුළත් විය හැකි ය :-

(අ) යම් තැනැත්තකු එම සංවිධානයේ සාමාජිකයකු වීම තහනම් කිරීම;

(ආ) එකී සංවිධානය විසින් එකී සංවිධානයට සාමාජිකයන් බඳවා ගැනීම තහනම් කිරීම;

(ඇ) යම් තැනැත්තකු විසින් එකී සංවිධානයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා යම් ක්‍රියාවක් කිරීම තහනම් කිරීම;

(ඈ) එම සංවිධානය විසින් රැස්වීම්, ක්‍රියාකාරකම් සහ වැඩසටහන් පැවැත්වීම තහනම් කිරීම;

(ඉ) එම සංවිධානයේ බැංකු ගිණුම් සහ වෙනත් මූල්‍ය තැන්පතු භාවිතය හෝ යෙදවීම තහනම් කිරීම;

(ඊ) ගිවිසුම්වලට එළඹීම තහනම් කිරීම;

(උ) අරමුදල් රැස්කිරීම සහ ප්‍රදාන සහ රික්තවරණ ලබා ගැනීම තහනම් කිරීම;

(ඌ) සංවිධානයේ අරමුදල් සහ වත්කම් පැවරීම තහනම් කිරීම;

(එ) එම සංවිධානය වෙත පොළඹවා ගැනීම සහ ඒ සංවිධානය වෙනුවෙන් යාචනය කිරීම තහනම් කිරීම; හෝ

(ඒ) යම් තැනැත්තකු විසින් එම සංවිධානයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා යම් දෙයක් පළ කිරීම තහනම් කිරීම.

(4) (1) වන උපවගන්තිය යටතේ තහනම් නියමයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් සංවිධානයක් සම්බන්ධයෙන් ද, ඒ සංවිධානය සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද යම් තහනම් කිරීමක්, සීමා කිරීමක්, අත්හිටුවීමක් හෝ සම්බාධකයක්, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් තහනම් නියමයකට අගතියක් නොමැතිව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(5) තහනම් නියමයක් ගැසට් පත්‍රයේ පළ කළ වහාම, එය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් සංවිධානයක් සම්බන්ධයෙන් ද, ඒ සංවිධානය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු අතර, සන්නිවේදනයක් කිරීමට හැකි සෑම අවස්ථාවක දී ම, සෘජු සන්නිවේදනය මාර්ගයෙන් එම සංවිධානයේ සාමාජිකයන් සහ සේවා නියුක්තයන් වෙත ඊට අදාළ හේතු ද සමග ඒ පිළිබඳ වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය. එම නියමය සම්බන්ධයෙන් මහජනයා වෙත ද නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද තහනම් නියමයකින් අතෘප්තියට පත් තැනැත්තකු හෝ සංවිධානයක් විසින්

කරන ලද ඉල්ලීමක් මත, ජනාධිපතිවරයා විසින් එම තැනැත්තා හෝ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසුව එම නියමය සමාලෝචනයට භාජනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(7) (අ) මේ වගන්තිය යටතේ, නිකුත් කරනු ලබන තහනම් නියමයක් මුල් අවස්ථාවේ දී අවුරුද්දක කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) එකී අවුරුද්දක කාලය ඉකුත් වීමෙන් පසුව, ජනාධිපතිවරයා විසින්, කාලීන සහ විශ්වසනීය තොරතුරු සහ ආරක්ෂක අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, එවැනි නියමයක් එක් වරකට අවුරුද්දක් නොඉක්මවන වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(8) තහනම් නියමයක් මගින් හෝ එහි යම් දීර්ඝ කිරීමක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට හෝ සංවිධානයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ඉල්ලීමක් කිරීමට හිමිකම තිබිය යුතු ය.

ජනාධිපතිවරයා විසින් සීමා කිරීමේ නියම කරනු ලැබිය හැකි බව

**80.** (1) පොලිස්පතිවරයා විසින් කරනු ලබන නිර්දේශයක් මත, යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කර ඇති බව හෝ වරදක් සිදු කිරීමට සූදානම් වෙමින් සිටින බව ද එම තැනැත්තාව සිරභාරයට ගැනීමෙන් තොරව ඔහුගේ ක්‍රියාකලාපය විමර්ශනය කිරීමට **නොහැකි බව ද** විශ්වාස කිරීමට ජනාධිපතිවරයාට සාධාරණ හේතු ඇත්තා වූ ද, එසේ කිරීම අවශ්‍ය බව ජනාධිපතිවරයාගේ මතය වන්නා වූ ද අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමෙන් පසුව ලබා ගත් ඒ අධිකරණයේ අවසරය ඇතිව, ජනාධිපතිවරයා විසින් (මින්මතු "සීමා කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලිඛිත නියමයක්, එම නියමයෙහි නිශ්චිතව දක්වනු ලබන පරිදි වූ සීමා කිරීම් පනවමින් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සීමා කිරීම් දැක්වෙන නියමයක පහත සීමා කිරීම් ඇතුළත් විය හැකි ය :-

(අ) පදිංචි ස්ථානයෙන් බැහැරව එහා මෙහා යාම සීමා කිරීම;

(ආ) විදේශගත වීම සීමා කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත ගමන් කිරීම සීමා කිරීම;

(ඈ) පදිංචි ස්ථානය සහ සේවයේ නියුක්ත ස්ථානය අතර සාමාන්‍ය ගමන් මාර්ගයෙන් බැහැරව ගමන් කිරීම සීමා කිරීම;

(ඉ) නියමයෙහි නිශ්චිතව දක්වනු ලබන තැනැත්තන් සමග සන්නිවේදනය කිරීම හෝ ආශ්‍රය කිරීම හෝ ඒ දෙකම සීමා කිරීම; හෝ

(ඊ) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට පහසුකම් සැලසෙන ආකාරයේ ඇතැම් නිශ්චිතව දක්වනු ලබන ක්‍රියාකාරකම්වල නිරත වීම සීමා කිරීම.

(3) එවැනි යම් සීමා කිරීමේ නියමයකින් යම් නිශ්චිතව දක්වනු ලබන දිනයක හෝ නිශ්චිතව දක්වනු ලබන කාල පරාසයන්හි දී යම් පොලිස් ස්ථානයක් වෙත වාර්තා කිරීමට එම සැකකරුට නියම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වන සීමා කිරීමේ නියමයක් -

(අ) මේ පනත යටතේ යම් වරදක් කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන්නේ නම්;

(ආ) මේ පනත යටතේ වරදක් කිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය වන්නේ නම්;

(ඇ) මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන හෝ කරනු ලැබීමට ඉඩ ඇති වරදට සමානුපාතික වන්නේ නම්; සහ

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, අත්තනෝමතිකව නිදහස අහිමි කිරීමකට හෝ මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සීමා කිරීමකට හෝ හේතු නොවන්නේ නම්,

පමණක් කරනු ලැබිය යුතු ය.

(5) අධිකරණය විසින්, එවැනි යම් සීමා කිරීමේ නියමයක්, එම සීමා කිරීමේ නියමය කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තාට භාර දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එම නියමය බලාත්මක කිරීමට සහ ඊට අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පොලිස්පතිවරයාට නියම කරනු ලැබිය යුතු ය.

(6) (අ) පොලිස්පතිවරයා විසින්, සීමා කිරීමේ නියමය කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා විසින් ප්‍රකාශ ලබා දී සතියක කාලයක් ඇතුළත එම ප්‍රකාශ සටහන් කර ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු අතර, එකී නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය යුතු ද වෙනස් කරනු ලැබිය යුතු ද යන්න ජනාධිපතිවරයාට තීරණය කිරීමට හැකි වන පරිදි ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙර, මේ පනත යටතේ ඔහුගේ අයිතිවාසිකම් පිළිබඳ අදාළ තැනැත්තා දැනුවත් කරනු ලැබිය යුතු අතර, සීමා කිරීමේ නියමය කිරීමට හේතු පිළිබඳව ද ඔහු දැනුවත් කරනු ලැබිය යුතු ය.

(ඇ) ප්‍රකාශය සටහන් කර ගැනීමට පෙර, අදාළ තැනැත්තා විසින් නීතිඥවරයකු මුණගැසීමට හෝ නීතිඥවරයකු සමග රහස් සන්නිවේදනයක් පැවැත්වීමට ඉල්ලීමක් කරන්නේ නම්, ඔහුට ඒ සඳහා අවසර ලබා දෙනු ලැබිය යුතු ය.

(ඈ) අවශ්‍ය අවස්ථාවක දී, භාෂණ පරිවර්තකයකුගේ සේවය සහිතව, සම්මුඛ සාකච්ඡාව පවත්වාගෙන යාම සහ ප්‍රකාශ සටහන් කර ගැනීම, සම්මුඛ සාකච්ඡාවට භාජනය වන තැනැත්තාට තේරුම්ගත හැකි භාෂාවකින් සිදු කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, භාෂණ පරිවර්තකයකුගේ සේවය ලබා ගන්නා අවස්ථාවක දී, සම්මුඛ සාකච්ඡාව සහ එහි පරිවර්තන සටහන් කර, අනුපිටපත් කර අනාගතයේ දී සත්‍යායනය කිරීම සඳහා සංරක්ෂණයකර තැබිය යුතු ය.

(ඉ) හැකි කවර වූ හෝ සෑම අවස්ථාවක දී, සම්මුඛ සාකච්ඡාව ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් පටිගත කර තැබිය යුතු ය.

(7) මේ පනත යටතේ කරනු ලබන සීමා කිරීමේ නියමයක් හිතාමතාම උල්ලංඝණය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, වසර තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(8) ජනාධිපතිවරයා විසින්, මේ වගන්තිය යටතේ කරන ලද සීමා කිරීමේ නියමයක්, සෑම මසක ම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වේ නම්, එහි කාලසීමාව දීර්ඝ කරනු ලැබිය යුතු ය.

(9) යම් සීමා කිරීමේ නියමයක මුළු කාලසීමාව මාස හයක් නොඉක්මවිය යුතු ය.

(10) සීමා කිරීමේ නියමයක් හෝ එහි දීර්ඝ කිරීමක් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකුට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ඉල්ලීමක් කිරීමට හිමිකම තිබිය යුතු ය.

ඇඳිරි නීති නියම

81. (1) (140 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ජනාධිපතිවරයා විසින් (මින්මතු "ඇඳිරි නීති නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, (2) වන උප වගන්තියේ දක්වා ඇති කාර්ය සඳහා සහ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දේශීය ජල තීරය සහ ගුවන් අවකාශය ද ඇතුළුව මුළු ශ්‍රී ලංකාවටම හෝ ශ්‍රී ලංකාවේ කොටසකට එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා මේ පනත යටතේ ඇඳිරි නීතිය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් -

(අ) මේ පනත යටතේ ක්‍රමානුකූල සහ පුළුල් ලෙස ව්‍යාප්ත වූ ත්‍රස්තවාදය හෝ වෙනත් වැරදි සිදු කිරීම පාලනය කිරීමේ, අනාවරණය කර ගැනීමේ හෝ විමර්ශනය කිරීමේ කාර්ය සඳහා;

(ආ) මේ පනත යටතේ ත්‍රස්තවාදය සහ වෙනත් වැරදිවලින් ජාතික හෝ මහජන

ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ කාර්ය සඳහා; හෝ

(ඇ) මේ පනත යටතේ ක්‍රමානුකූල සහ පුළුල් ලෙස ව්‍යාප්ත වූ වැරදි සිදු කිරීම වැළැක්වීමේ කාර්ය සඳහා,

ඇඳිරි නීති නියමයක් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(3) (අ) යම් ඇඳිරි නීති නියමයක උපරිම කාලසීමාව එක් වරකට පැය විසි හතරක් නොඉක්මවිය යුතු ය.

(ආ) ඇඳිරි නීති කාලසීමාවන් දෙකක් අතර, අවම වශයෙන් පැය තුනක කාලසීමාවක කාල පරතරයක් පැවතිය යුතු ය.

(4) ඇඳිරි නීති නියමයක්, මානුෂීය අවශ්‍යතා සැපයීම සඳහා පනවනු ලැබිය හැකි යම් නිදහස් කිරීම්වලට යටත්ව නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) එවැනි යම් ඇඳිරි නීති නියමයක -

(අ) එම නියමය අදාළ වීමෙන් නිදහස් කරනු ලබන තැනැත්තන් ප්‍රභේද නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය;

(ආ) (i) යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඇඳිරි නීති නියමයට අනුකූලව ක්‍රියා කිරීමෙන් නිදහස් කරමින්; සහ

(ii) බලපත්‍රයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි අත්‍යවශ්‍ය සේවා සහ සැපයුම් හදිසි අවශ්‍යතා සහ මානව අවශ්‍යතා පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව හේතුවෙන් එවැනි තැනැත්තකු හෝ තැනැත්තන්ට එක් ස්ථානයකින් තවත් ස්ථානයකට ගමන් කිරීමට බලය ලබා දෙමින්,

බලපත්‍ර නිකුත් කිරීමට බලය ලබා දී ඇති යම් තැනැත්තකු නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(6) ඇඳිරි නීති නියමයකින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් නිදහස් වීමට අවශ්‍ය යම් තැනැත්තකු, (5) වන උපවගන්තියේ දක්වා ඇති බලධරයාට, නියම කරනු ලබන ආකෘතියෙන් ඉල්ලීමක් කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(7) ඇඳිරි නීති නියමයක් හිතාමතාම උල්ලංඝනය කරනු ලබන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(8) ඇඳිරි නීති නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට වගබලා ගැනීමේ අනෙකුත් සියලු ක්‍රම නිරර්ථක වී ඇති බව තහවුරු වී ඇති අවස්ථාවක දී, ඇඳිරි නීති නියමයකට අනුකූලව ක්‍රියා කිරීමට වගබලා ගැනීමට අවශ්‍ය විය හැකි සාධාරණ බලය යම් සිරභාරයට ගන්නා නිලධරයකු විසින් භාවිත කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

**82.** (1) මේ පනතේ කාර්ය සඳහා, ජනාධිපතිවරයා විසින්, පොලිස්පතිවරයාගේ හෝ, පිළිවෙළින්, යුධ හමුදාපතිවරයාගේ, නාවික හමුදාපතිවරයාගේ හෝ ගුවන් හමුදාපතිවරයාගේ හෝ වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, (මින්මතු "තහනම් ස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් මහජන භාවිතා ස්ථානයක් හෝ වෙනත් යම් ස්ථානයක් තහනම් ස්ථානයක් බවට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කලින් කල, නියම කරනු ලැබිය හැකි ය. තහනම් ස්ථාන

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියමයක, තහනම් ස්ථානයකට ඇතුළු වීම තහනම් කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී තහනම් ස්ථානය ඡායාරූප ගත කිරීම, වීඩියෝ පටිගත කිරීම සහ දළ සටහන් සකස් කිරීම තහනම් කිරීම ද ඇතුළත් විය හැකි ය.

(3) තහනම් ස්ථානයක් සම්බන්ධයෙන් වන නියමය ගැසට් පත්‍රයේ පළ කිරීමට අමතරව, වෙනත් ආකාරයකින් ඊට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබා දිය යුතු ය.

(4) තහනම් ස්ථානයක් ලෙස ස්ථානයක් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, එම ස්ථානය තහනම් ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බව සඳහන් කරමින් හැකි අවස්ථාවල දී එම ස්ථානයට ඇතුළු වන ස්ථානවල නිවේදන තැබිය යුතු ය.

(5) (අ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක වන කාලසීමාව දින හතක් නොඉක්මවිය යුතු ය.

(ආ) එවැනි යම් නියමයක් ක්‍රියාත්මක වන කාල සීමාව දින හතක් ඉක්මවනු ලබන කාල සීමාවකට වඩා දීර්ඝ කරනු ලැබීමට අවශ්‍ය අවස්ථාවක දී, තත් කාර්යය සඳහා තහනම් ස්ථානය පිහිටි ප්‍රදේශයේ නිසි අධිකරණ බලය හිමි මහෙස්ත්‍රාත්වරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. එම මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ආඥාව නිකුත් කිරීමට පෙරාතුව ඒ ආඥාව කිරීමට ඇති අවශ්‍යතාවය පිළිබඳ සෑහීමට පත් වී ඒ ආඥාව යම් කොන්දේසිවලට යටත් ව නිකුත් කරනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමෙන් පසුව, තහනම් ස්ථානය භාර නිලධරයා හෝ ජනාධිපතිවරයා විසින් බලය ලබා දී ඇති පරිදි තහනම් ස්ථානය පිළිබඳව නීත්‍යනුකූල බලය සහ පාලනය සහිත වෙනත් තැනැත්තකු විසින් එම ස්ථානයට ඇතුළු වීමට සහ එහි රැඳී සිටීමට බලය ඇති පුද්ගල කාණ්ඩ නිශ්චිතව දක්වනු ලැබිය යුතු අතර, ඔහු විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කොන්දේසි මත එම ස්ථානයට වෙනත් යම් තැනැත්තකුට ඇතුළු වීමට අවසර ලබා දීමට ද ඔහුට හිමිකම ඇත්තේ ය.

(7) නීත්‍යනුකූල අවසරයකින් තොරව තහනම් ස්ථානයකට ඇතුළු වීමෙන් හෝ එහි රැඳී සිටීමෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් හිතාමතාම උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(8) තහනම් ස්ථානයක ඡායාරූප ගැනීමෙන්, වීඩියෝ පටිගත කිරීමෙන් සහ දළ සටහන් සකස් කිරීමෙන් (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් හිතාමතාම උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(9) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "මහජන භාවිත ස්ථානය" යන්නට, අදාළ වේලාවේදී මහජනතාවට අයිතියක් ලෙස හෝ අන්‍යාකාරයකින් ප්‍රවේශ විය හැකි හෝ ප්‍රවේශ වීමට අවසර ඇති යම් මහා මාර්ගයක් සහ වෙනත් යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් ඇතුළත් වේ.

**දේපළ තහනමට ගැනීම, රාජසන්තක කිරීම සහ ජනරජය සන්තක කිරීම**

83. (1) මේ පනත යටතේ වරදක් සිදු කිරීමට භාවිත කරන ලද හෝ වරදක් සිදු කිරීමට සම්බන්ධ හෝ වරදක් සිදු කිරීමෙන් ව්‍යුත්පන්න වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් පොලිස් නිලධරයකු විසින් තහනමට ගනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් තහනමට ගැනීමක්, පොලිස් ස්ථානයක් භාර නිලධරයකුගේ ඉල්ලීම මත මහෙස්ත්‍රාත්වරයකු විසින් ස්ථිර කර දීර්ඝ කරනු ලැබුවේ නම් මිස, එම තහනමට ගැනීමේ දින සිට දින තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(3) ඉහත සඳහන් පරිදි ස්ථිර කර දීර්ඝ කරනු නොලැබූ යම් දේපළ තහනමට ගැනීමක්, ඉහත සඳහන් දින තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව බලාත්මක වීම අවසන් විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ස්ථිර කර දීර්ඝ කරන ලද යම් දේපළ තහනමට ගැනීමක්, පොලිස් ස්ථානයක් භාර නිලධරයකුගේ ඉල්ලීම මත අදාළ වරද සම්බන්ධයෙන් වන නඩු විභාගය අවසන් වන තුරු දීර්ඝ කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් අවසර ලබා දී ඇත්තේ නම් මිස, එම ස්ථිර කිරීමේ දින සිට දින අනූවක් ඉකුත් වීමේ දී බලාත්මක වීම අවසන් විය යුතු ය.

(5) යම් තැනැත්තකු එසේ තහනමට ගන්නා ලද දේපළ සම්බන්ධයෙන් හිමිකම තහවුරු කරනු ලබන අවස්ථාවක දී, -

(අ) වරද සිදු කිරීම පිළිබඳ කිසිදු දැනුමක් නොමැති සද්භාවී හිමිකරු එම තැනැත්තා වන බවට; හෝ

(ආ) එකී වරද සිදු කිරීම වැළැක්වීම සඳහා එම තැනැත්තා නිසි උද්‍යෝගයෙන් කටයුතු කරන ලද බවට,

මහෙස්ත්‍රාත්වරයා සෑහීමකට පත් වන්නේ නම්, නියම කරනු ලැබිය හැකි කොන්දේසි මත, මහෙස්ත්‍රාත්වරයා විසින්, හිමිකම

තහවුරු කරනු ලබන තැනැත්තා වෙත එම දේපළ මුදා හරිනු ලැබිය හැකි ය.

(6) මේ පනත යටතේ යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී වරදකරු කිරීමට එරෙහිව වන අභියාචනයක තීරණයට යටත්ව, එම වරද කිරීමේ දී භාවිත කරන ලද හෝ එම වරද කිරීමෙන් ව්‍යුත්පන්න වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් රාජසන්තක කර ජනරජය සන්තක කළ යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(7) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු නිදොස් කර ඇති අවස්ථාවක දී, එම වරද කිරීමට භාවිත කරන ලද හෝ එම වරද සිදු කිරීමෙන් ව්‍යුත්පන්න වූ යම් දේපළක් රාජසන්තක කර ජනරජය සන්තක කළ යුතු බවට අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(8) (6) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එම දේපළෙහි හිමිකරුගේ දැනුම නොමැතිව සහ කැමැත්තෙන් තොරව මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා යම් තැනැත්තකු විසින් භාවිත කර ඇති, එසේ රාජසන්තක කරන ලද සහ ජනරජය සන්තක කරන ලද යම් දේපළක්, එම රාජසන්තක කිරීමෙන් සහ ජනරජය සන්තක කිරීමෙන් නිදහස් කළ යුතු ය.

(9) මේ වගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකුට අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(10) (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධාන මේ පනත යටතේ වරදක් කිරීම සඳහා භාවිත කරන ලද යම් උපකරණයක්, ආයුධයක්, වෙඩි බෙහෙත් හෝ මෙවලමක් සඳහා අදාළ නොවිය යුතු ය.

## XI වන කොටස

### දඬුවම් දීමට අදාළ මාර්ගෝපදේශ

දඬුවම බරපතළ වන කරුණු

84. මේ පනත යටතේ වරදක් සිදු කර වරදකරුවකු කරන ලද තැනැත්තකු වෙත පැනවිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව, බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව වැඩිකර ලබා දීමට හේතු වන බරපතළ කරුණු ලෙස පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි ය :-

(අ) ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීභාවයට හෝ වෙනත් ස්වෛරී රාජ්‍යයක භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරීභාවයට, අදාළ වරද සිදු කිරීමෙහි බලපෑම;

(ආ) ශ්‍රී ලංකාවේ ආරක්ෂාව මත හෝ රාජ්‍ය ආරක්ෂාව මත අදාළ වරද සිදු කිරීමේ බලපෑම;

(ඇ) වරද සිදු කිරීම හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව;

(ඈ) වරද සිදු කිරීම මහජන නොසන්සුන්තාවක් ඇති කළේ ද යන වග;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකුට කරන ලද තුවාල හෝ හානි;

(ඊ) වින්දිතයන් මත වරදෙහි බලපෑම සහ ඔවුන් විසින් විඳිනු ලැබූ ප්‍රතිවිපාකයන්හි බරපතළ ස්වභාවය;

(උ) පොදු ජනතාවගේ ආරක්ෂාව මත වන බලපෑම;

(ඌ) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සාමකාමී සහජීවනය මත වන බලපෑම;

(එ) ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ පොදු ජනතාවට ඇති වූ මුල්‍යමය සහ ද්‍රව්‍යමය පාඩුව;

(ඒ) ඇති වූ අලාභවලට හානිපූරණය කිරීම සහ අලාභ යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මුල්‍යමය සහ වෙනත් සම්පත්; සහ

(ඔ) දඬුවම බරපතල කිරීමේ කරුණු ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණු.

දඬුවම ලිහිල් කිරීමේ කරුණු

85. මේ පනත යටතේ වරදක් සිදුකර වරදකරුවකු කරන ලද තැනැත්තකු වෙත පැනවිය යුතු බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව තීරණය කිරීමේ දී, මේ පනතේ විධිවිධානවලට යටත්ව බන්ධනාගාරගත කිරීමේ කාලසීමාව ලිහිල් කිරීමට හේතුවන ලිහිල් කිරීමේ කරුණු ලෙස පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනු ලැබිය හැකි ය :-

(අ) ත්‍රස්තවාදය ප්‍රසිද්ධියේ හෙළා දැකීම ;

(ආ) පසුතැවිල්ල ප්‍රකාශ කිරීම;

(ඇ) වරද සිදු කරන අවස්ථාවේ දී තරුණ වයසේ සිටීම;

(ඈ) දඬුවම් පනවන අවස්ථාවේ දී මහලු වයසේ සිටීම;

(ඉ) රඳවා තබන ලද හෝ රිමාන්ඩ් භාරයේ ගත කරන ලද කාලසීමාව;

(ඊ) වරද සිදු කරන ලද්දේ බලකිරීමක් හෝ උත්තර්ජනයක් යටතේ ද එසේ බලකිරීමක් හෝ තර්ජනයක් යටතේ වරද සිදු කරන ලද බව;

(උ) චූදිතයා විසින් ස්වේච්ඡාවෙන්ම වරදෙහි වින්දිතයන්ට හානිපූරණ ලබා දීම;

(ඌ) චූදිතයාව වරදකරු කරනු ලැබූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ වෙනත් වැරදි සම්බන්ධයෙන්

ප්‍රසිද්ධියේ හෙළා දැකීම;

(එ) ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරීභාවය සුරක්ෂිත කිරීමට සහ ආරක්ෂා කිරීමට අවංක ලෙස කැපවීම;

(ඒ) අධිකරණය විසින් දක්වනු ලබන පුනරුත්ථාපන වැඩසටහනකට ස්වේච්ඡාවෙන් සහභාගි වීම සහ පුනරුත්ථාපන වැඩසටහනක් සම්පූර්ණ කිරීම; හෝ

(ඔ) දඬුවම ලිහිල් කිරීමේ කරුණක් ලෙස සැලකිල්ලට ගනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් කරුණක්.

## **XII** වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඇතැම් විධිවිධාන අදාළ නොවිය යුතු බව

**86.** අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ යම් අධිකරණයක් විසින් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට එකී පනතේ 306 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ළමා ආඥාපනත අදාළ වන බව

**87.** මේ පනත යටතේ වරදක් කිරීම සම්බන්ධව වරදකරු වූ සහ එවැනි වරදකට වරදකරු කරනු ලැබූ යම් ළමයකුට (23 වන අධිකාරය වූ) ළමා ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

නිලධරයන් ආදීන්ට ආරක්ෂාව

**88.** (1) මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් විධානයක් සම්බන්ධයෙන් මේ පනත යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි නීති කෘත්‍යයක දී ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, මේ පනත යටතේ කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් විධානයක් අනුව සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් හෝ

දෙයක් සම්බන්ධයෙන් යම් නිලධරයකුට හෝ තැනැත්තකුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක්, චෝදනාවක් හෝ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම නොකළ යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි

**89.** මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ විට, ඒ පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු සහ ප්‍රධාන විධායක නිලධරයකු ම;

(ආ) හවුල් ව්‍යාපාරයක් නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) හවුල් ව්‍යාපාරයක් නොවන සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම් එහි කළමනාකාරිත්වය හා පාලනය සඳහා වග කිව යුතු ඒ මණ්ඩලයේ සෑම නිලධරයකු ම,

එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම ඇතිව නොවන බව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි සියලු උද්යෝගයෙන් යුතු ව ක්‍රියා කළ බව හෝ ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, එවැනි තැනැත්තකු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

නියෝග

**90.** (1) මේ පනතේ කාර්ය, ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ එම නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ එම නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත

පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ නිසි ලෙස කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

විධාන

**91.** (1) ජනාධිපතිවරයා විසින්, මේ පනතේ විධිවිධාන බලාත්මක කළ යුතු ආකාරයට අදාළව පොලිස් නිලධරයන්ට, සන්නද්ධ හමුදා නිලධරයන්ට සහ වෙරළ ආරක්ෂක නිලධරයන්ට අදාළ විය යුතු විධාන මේ පනතේ විධිවිධානවලට යටත්ව, කලින් කලට, නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන හුදෙක් ම, කාර්යක්ෂම ආකාරයෙන් මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා විය යුතු අතර, නීතියෙන් පිළිගනු ලබන මානව හිමිකම් න්‍යායන් සහ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

(3) ඒ සෑම විධානයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

පුනරුත්ථාපන වැඩසටහන්

**92.** (1) 70 වන වගන්තිය යටතේ නීතිපතිවරයා විසින් අපරාධ නඩු කටයුතු අත්හිටුවීම සහ කල් තැබීම නිර්දේශ කරනු ලැබ ඇත්තේ හෝ 76 වන වගන්තිය යටතේ අධිචෝදනා ඉල්ලා අස්කර ගනු ලැබ ඇත්තේ යම් තැනැත්තන් සම්බන්ධයෙන් ද එකී තැනැත්තන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජනාධිපතිවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියෝගවලට -

(අ) වැඩසටහන පැවැත්වීම මගින් සාක්ෂාත් කරගත යුතු අරමුණු;

(ආ) පුනරුත්ථාපන කටයුතුවල ස්වභාවය;

(ඇ) සපයනු ලබන පුහුණුවේ ස්වභාවය;

(ඈ) පුනරුත්ථාපනය හෝ පුහුණුව පවත්වන අධිකාරිය හෝ අධිකාරීන්;

(ඉ) වැඩසටහන පවත්වනු ලබන ස්ථානය;

(ඊ) වැඩසටහන පවත්වනු ලබන කාල සීමාව; සහ

(උ) මේ වගන්තිය යටතේ යම් පුනරුත්ථාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අදාළ වන වෙනත් යම් කාරණා,

ඇතුළත් විය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලපවත්වන බව

**93.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ එවැනි වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් පවතින අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අධිකරණ සමාලෝචන

**94.** මේ පනත යටතේ යම් අදාළ අධිකාරියක් විසින් ලබා දෙන ලද යම් තීරණයකින්, නිශ්චය කිරීමකින්, නියමයකින් හෝ විධානයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අධිකරණ සමාලෝචනය මගින් සහනයක් ඉල්ලීම වළක්වනු ලබන ලෙස මේ පනතේ අන්තර්ගත වන කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

## **XIII** වන කොටස

### ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

1979 අංක 48 දරන පනත ඉවත් කිරීම

**95.** 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන

**96.** (මින් මතු "ඉවත් කරන ලද පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත ඉවත් කිරීම නොතකා -

(අ) ඉවත් කරන ලද පනත යටතේ යම් අධිකරණයක හෝ වෙනත් අධිකාරයක සිදු කරනු ලැබූ, පවත්වනු ලැබූ, ඒ වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ කරනු ලැබූ සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පැවති යම් විමර්ශනයක්, නඩු විභාගයක්, අභියාචනයක් හෝ ඉල්ලීමක් ප්‍රායෝගිකව හැකිතාක් දුරට කාර්ය පටිපාටිය සහ සාක්ෂිවලට අදාළ විධිවිධාන ද ඇතුළත්ව, ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ විභාග කර අවසන් කිරීම, ඉදිරියට පවත්වාගෙන යාම, පවත්වාගෙන යාම හෝ ඇසීම කරනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ඉවත් කරන ලද පනත යටතේ වරදක් කරනු ලැබූ බවට හෝ වරදක් කිරීමට සම්බන්ධ වූ බවට සැකයට භාජනය වී සිටින්නා වූ ද මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වන විට නඩු පවරනු ලැබ නොමැති වූ ද යම් තැනැත්තකුහට ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ ඊට විරුද්ධව නඩු පවරනු ලැබිය යුතු අතර, එවැනි යම් වරදක් සඳහා වන නඩු කටයුතු අදාළ අධිකාරිය විසින් ප්‍රායෝගිකව හැකිතාක් දුරට මේ පනතේ විධිවිධාන යටතේ පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් වරදක් සඳහා අධිචෝදනා ගොනු කිරීමට පෙර, නීතිපතිවරයා විසින් මේ පනතේ 70 වන වගන්තිය යටතේ අපරාධ නඩු කටයුතු අත්හිටුවීමේ හෝ කල් තැබීමේ හැකියාව සලකා බැලිය යුතු ය;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම ඉවත් කරන ලද පනත යටතේ දෙනු ලැබූ සියලු දණ්ඩන

නියම සහ වාර්තා කරනු ලැබූ හෝ කරනු ලැබූ යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ පිළිවෙළින් දෙනු ලැබූ, වාර්තා කරනු ලැබූ හෝ කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කිරීම හා ක්‍රියාවට නැංවීම කරනු ලැබිය යුතු ය;

(ඇ) යම් සංවිධානයක් තහනම් කිරීමේ නියෝග ද ඇතුළත් ව නමුත් එම නියෝගවලට සීමා නොවී 2011 අගෝස්තු මස 29 වන දින අංක 1721/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගය ද ඇතුළත්ව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ඉවත් කරන ලද පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක් ම සහ නියමයක් ම මේ පනතේ අනුරූප විධිවිධාන යටතේ සාදනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව බලාත්මක කිරීම සහ ක්‍රියාවට නැංවීම කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**97.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි -

"ගුවන් යානයක්" යන්නට, හෙලිකොප්ටරය ඇතුළත් වේ;

"සන්නද්ධ හමුදා" යන්නෙන්, (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා නාවික හමුදාව සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අදහස් වේ;

"වෙරළ ආරක්ෂක නිලධරයා" යන්නට, 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"අපරාධ නඩු විධාන සංග්‍රහය පනත" යන්නෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත අදහස් වේ;

"ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 204 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"රහස්‍ය තොරතුරු" යන්නෙන්, -

(අ) පතුරුවා හැරීම මගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂාව හා රාජ්‍ය ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති යම් තොරතුරු;

(ආ) පතුරුවා හැරීම මගින් ජාතික ආරක්ෂාව හා මහජන ආරක්ෂාව කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති -

(i) පොලීසියේ, සන්නද්ධ හමුදාවල හෝ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ තැනැත්තන් සම්බන්ධයෙන් වන;

(ii) යම් නිශ්චිතව දක්වනු ලබන තැනැත්තකුගේ ක්‍රියා, ගමන් බිමන් හෝ සිටින ස්ථාන සම්බන්ධයෙන් වන;

(iii) තහනම් කළ ස්ථාන හෝ අනුමත කළ රඳවා තබාගැනීමේ ස්ථාන සම්බන්ධයෙන් වන;

(iv) මේ පනත යටතේ වන වැරදිවල විමර්ශන පැවැත්වීම, එකී විමර්ශනවල දී අනාවරණය කරගත් කරුණු, සිරභාරයට ගත් හා රඳවා තබාගත් තැනැත්තන්ගේ හා විමර්ශන පවත්වනු ලබන නිලධරයන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් වන,

පොදු ප්‍රවේශයක් නොමැති යම් තොරතුරු;

(ඇ) ක්‍රියාවට නැංවීමට අදහස් කරනු ලබන හෝ ක්‍රියාවට නංවනු ලබන හෝ ක්‍රියාවට නංවා ඇති යම් නීතියක බලාත්මක කිරීමේ පියවරක් හෝ යුදමය පියවරක් ද ඇතුළත්ව යම් නිල කටයුත්තක් මෙහෙයවීම පිළිබඳ පොලීසිය හෝ සන්නද්ධ හමුදාවලට අදාළ යම් තොරතුරක්;

(ඈ) ජාතික ආරක්ෂාවට හා රාජ්‍ය ආරක්ෂාවට අදාළ යම් රහස් කේත අංකයක්, වචනයක්, මුරපදයක් හෝ දත්ත සැඟවීමේ විස්තරයක්,

අදහස් වේ.

"අගමන හා විගමන පාලක ජනරාල්වරයා" යන්නෙන්, (351 වන අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 4 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ පාලක ජනරාල්වරයා අදහස් වේ;

"ආනයන සහ අපනයන පාලක ජනරාල්වරයා" යන්නෙන්, 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ පාලක ජනරාල්වරයා අදහස් වේ;

"ඇඳිරි නීතිය" යන්නෙන්, යම් මාර්ගයක්, දුම්රිය මාර්ග යක්, උමඟක්, දේශීය මුහුදු තීරය, දිය පාරක්, උද්‍යානයක්, වෙළෙඳපොළක්, මුහුදු වෙරළ සහ විනෝද උයන් ඇතුළුව මහජන භාවිත ස්ථානයක සිටීමේ හෝ එවැනි ස්ථානයක් තුළ හෝ ඒ හරහා ගමන් කිරීමේ තහනම අදහස් වේ;

"නාමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාර" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ එම යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂවරයා" යන්නෙන්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පත්කරන ලද මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධානියා අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 2 වන වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 19 වන වගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22ආ වන වගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"සාක්ෂි ආඥාපනත" යන්නෙන්, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනත අදහස් වේ;

"තුටු පඬුර" යන්නට, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ ඒ යෙදුමට දෙන ලද අර්ථයම ඇත්තේ ය;

"විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අර්ථානුකූලව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වේ;

"ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව" යන්නෙන්, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අදහස් වේ;

"බැංකු නොවන මූල්‍ය ආයතනය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"දණ්ඩ නීති සංග්‍රහය" යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, තනි පුද්ගලයකු, පුද්ගල කණ්ඩායමක්, සමිතියක්, සංවිධානයක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"පොලිස් ආඥාපනත" යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත අදහස් වේ;

"තහනම් කරන ලද ත්‍රස්තවාදී සංවිධානය" යන්නට, 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත ප්‍රකාරව සාදන ලද නියෝගයක් යටතේ

තහනම් කරනු ලැබූ යම් සංවිධානයක් ඇතුළත් වේ;

"සමාගම් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 471 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"නියමුවකු රහිත ගුවන්යානය" යන්නෙන්, දුරස්ථව හැසිරවීමේ හෝ පාලනය කිරීමේ හැකියාව ඇති හෝ නොමැති යම් වස්තුවක් තුළ සිටින මනුෂ්‍යයකු මගින් ඒ වස්තුව හැසිරවීමේ හැකියාවක් නොමැති යාන්ත්‍රික හෝ ස්වයංක්‍රීය පියාසර වස්තුවක් අදහස් වේ;

"වින්දිතයා" යන්නෙන්, වරදක් සම්බන්ධයෙන් වන විට, ළමා වින්දිතයකු ඇතුළුව -

(අ) මේ පනත යටතේ කරන ලදැයි කියනු ලබන වරදක් සංස්ථාපනය වන්නා වූ ; හෝ

(ආ) මේ පනත යටතේ වරදක් සිදුකිරීමේ දී යම් වෙනත් ලිඛිත නීතියක් යටතේ සිදුකරන කරන ලදැයි කියනු ලබන වරදක් සංස්ථාපනය වන්නා වූ,

යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස ශාරීරික හෝ මානසික, චිත්තවේගී, ආර්ථික හෝ වෙනත් අලාභයක් වන්නා වූ යම් හිංසාවක්, හානියක්, දුබලතාවක් හෝ ආබාධයක් අත්විඳින තැනැත්තකු අදහස් වන අතර, ඒ තැනැත්තාට සහාය වීමට මැදිහත් වීමේ හෝ වරදක් සිදුකිරීම වැළැක්වීමට සහාය වීමේ ප්‍රතිඵලයක් ලෙස හානියක් අත්විඳින තැනැත්තකු සහ වරදක ළමා වින්දිතයකුගේ මව්පියන් හෝ භාරකරු සහ ඒ තැනැත්තාගේ පවුලේ යම් සාමාජිකයකු සහ

ළගම ඥාතියා, යැපෙන්නන් සහ ඒ තැනැත්තාට සුවිශේෂි වැදගත්කමක් ඇති වෙනත් තැනැත්තකු ද ඇතුළත් වේ;

"සාක්ෂිකරුවකු" යන්නෙන්, -

(අ) නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු වෙත තොරතුරු සපයා හෝ පැමිණිල්ලක් කර, ඒ තොරතුරු හෝ පැමිණිල්ල පදනම් කරගෙන මේ පනත යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් ආරම්භ කළ හැකි හෝ ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට ඉඩ ඇති විමර්ශනයක දී හෝ පරීක්ෂණයක දී, එසේ එම තොරතුරු සපයා ඇති හෝ පැමිණිල්ල කර ඇති තැනැත්තකු;

(ආ) මේ පනත යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් පිළිබඳව නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු විසින් පවත්වනු ලබන යම් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් අතරතුර දී, තොරතුරු සපයා ඇති හෝ තමාගෙන් ප්‍රශ්න කරන ලද කාරණා ඇතුළත් ප්‍රකාශයක් කර ඇති තැනැත්තකු;

(ඇ) මේ පනත යටතේ වන වරදක වින්දිතයකු විසින් කර ඇති පැමිණිල්ලක් හෝ පවරා ඇති නඩු කටයුත්තකට සහාය වීමක් වශයෙන් යම් දිවුරුම් පෙත්සමක් සපයා ඇති හෝ ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති තැනැත්තකු;

(ඈ) කොමිෂන් සභාවකට තොරතුරු හෝ යම් සන්නිවේදනයක් සපයා ඇති තැනැත්තකු;

(ඉ) යම් තැනැත්තෙකු විසින් නීතිය බලාත්මක කිරීමේ නිලධරයකුට හෝ කොමිෂන් සභාවකට සපයන ලද තොරතුරු හෝ කරන ලද ප්‍රකාශයක් මුල් කරගෙන යම් තැනැත්තකුට එරෙහිව යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී ප්‍රකාශයක් කිරීමට හෝ සාක්ෂි දීමට ඒ අධිකරණය විසින් හෝ කොමිෂන් සභාව විසින් තොරතුරු සැපයූ හෝ ප්‍රකාශය කළ එම තැනැත්තා කැඳවන බවට, සාධාරණ හේතු මත ඔහු විශ්වාස කරන්නේ නම් එවැනි යම් තැනැත්තකු;

(ඊ) අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට පැවැත්වෙන යම් අධිකරණ හෝ අර්ධ අධිකරණ නඩු කටයුත්තක දී, ප්‍රකාශයක් කිරීමට, සාක්ෂි දීමට හෝ යම් ලේඛනයක්, වාර්තාවක් හෝ දෙයක් ඉදිරිපත් කිරීමට ඒ අධිකරණයෙන් හෝ කොමිෂන් සභාවෙන් සිතාසි ලැබූ යම් තැනැත්තකු; හෝ

(උ) මේ පනත යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් කර ඇති රජයේ නිලධරයකු,

අදහස් වන අතර, වරදක වින්දිතයකු, ළමා සාක්ෂිකරුවකු, ළමා සාක්ෂිකරුවකුගේ මව්පියන් හෝ භාරකරු, එවැනි සාක්ෂිකරුවකුගේ පවුලේ සාමාජිකයෙක් හෝ යැපෙන්නෙක් හෝ ඒ තැනැත්තාට සුවිශේෂී වැදගත්කමක් ඇති වෙනත් යම් තැනැත්තකු, විශේෂඥ සාක්ෂිකරුවකු සහ මේ පනත යටතේ සිදු කරන ලදැයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් සැකකරන හෝ චෝදනා ලත් තැනැත්තකු වෙනුවෙන් අධිකරණයක් හෝ කොමිෂන් සභාවක් ඉදිරිපිට සාක්ෂිදීම සඳහා කැඳවනු ලැබ ඇති තැනැත්තකු ද ඊට ඇතුළත් වේ.

(2) මේ පනතේ භාවිත කර ඇත්තා වූ ද, දණ්ඩ නීති සංග්‍රහයේ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථනිරූපණය කර ඇත්තා වූ ද, එහෙත් මේ පනතේ අර්ථ නිරූපණය කර නොමැත්තා වූ ද, යම් වචනයකට හෝ යෙදුමකට, පිළිවෙලින්, දණ්ඩ නීති සංග්‍රහයේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ඒ වචනය හෝ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**98.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## පළමුවන උපලේඛනය

[26(1) වගන්තිය]

### සිරභාරයට ගැනීම සහ අත්අඩංගුවට ගැනීම පිළිබඳ දැනුම්දීම

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම :-

2. සිරභාරයට ගන්නා ලද දිනය, වේලාව සහ ස්ථානය :-

3. සිරභාරයට ගැනීමට හේතු :-

4. සිරභාරයට ගනු ලැබූ තැනැත්තා අත්අඩංගුවේ තබා ගැනීමට හෝ රඳවා තබා ගැනීමට යෝජිත ස්ථානය :-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-

6. සිරභාරයට ගනු ලැබූ තැනැත්තාගේ ළඟම ඥාතියාට ඔහු වෙත යුක්ති සහගතව ප්‍රවේශ වීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු :-

7. සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම්දීමක් නිකුත් කරනු ලබන තැනැත්තාගේ අනන්‍යතාවය :-

8. සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම්දීමක් නිකුත් කළ දිනය සහ වේලාව:-

9. සිරභාරයට ගැනීම පිළිබඳ දැනුම්දීමක් නිකුත් කළ නිලධරයාගේ නම, තනතුර සහ අත්සන :-

### දෙවන උපලේඛනය

[26(4) වගන්තිය]

**සිරභාරයට ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කරනු ලබන දැනුම්දීම**

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම :-

2. සිරභාරයට ගත් දිනය, වේලාව සහ ස්ථානය :-

3. සිරභාරයට ගැනීමට හේතු :-

4. සැකකරු රඳවා ඇති ස්ථානයේ පිහිටීම :-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-

6. රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ නම සහ පදවි නාමය සහ ඔහු සම්බන්ධ කර ගත හැකි විස්තර:-

7. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට රඳවා තැබූ තැනැත්තා වෙත ඉක්මණින් ප්‍රවේශ වීමට හැකි කරවීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු :-

### තුන්වන උපලේඛනය

[26(4) වගන්තිය]

**සිරභාරයට ගැනීම පිළිබඳ පොලිස්පතිවරයාට කරනු ලබන දැනුම්දීම**

1. සිරභාරයට ගන්නා ලද තැනැත්තාගේ නම :-

2. සිරභාරයට ගත් දිනය, වේලාව සහ ස්ථානය :-

3. සිරභාරයට ගැනීමට හේතු :-

4. සැකකරු රඳවා ඇති ස්ථානයේ පිහිටීම :-

5. සිරභාරයට ගන්නා නිලධරයාගේ නම, හඳුනාගැනීමේ අංකය සහ නිලය :-

6. රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයාගේ නම සහ පදවි නාමය සහ ඔහු සම්බන්ධ කර ගත හැකි විස්තර:-

**හතරවන උපලේඛනය**

[31(1)(ආ) වගන්තිය]

**රැඳවුම් නියමය**

1. රඳවා තැබීමේ නියමයේ අංකය :-

2. රඳවා තැබීමේ නියමය නිකුත් කරන නිලධරයාගේ නම සහ පදවි නාමය :-

3. රඳවා තැබීමේ නියමය නිකුත් කරනු ලබන දිනය සහ ස්ථානය :-

4. රඳවා තැබීමේ නියමය නිකුත් කිරීම සඳහා ඉල්ලා සිටින ලද නිලධරයාගේ අනන්‍යතාවය සහ එකී ඉල්ලීමේ දිනය සහ අදාළ වන්නේ නම් යොමු අංකය :-

5. රඳවා ගැනීමට බලය දෙනු ලැබූයේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ (සැකකරුගේ) නම :-

6. බලයලත් රඳවා තැබීමේ ස්ථානය :-

7. රඳවා තැබීමේ කාලසීමාව :-

8. සැකකරු රඳවා තැබීම සඳහා අවසර දී ඇති කාර්යය:-

9. රඳවා තැබීමේ කොන්දේසි :-

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.